## උතුරු පළාත් සභාව - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගිණුම්වල වැඩියෙන් දැක්වීම්**

පශු සම්පත් ගොවිපොළ, කෘෂිකාර්මික ගොවිපොළ සහ යාන්ත්‍රික වැඩපොළ පිළිබඳ අත්තිකාරම් ගිණුම් කටයුතුවල රු.12,756,497 ක් වූ බැර ශේෂයන් ජර්නල් සටහන් මඟින් පළාත් අරමුදල් ගිණුමට බැර ශේෂයන් ලෙස මාරු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත් අරමුදල් ගිණුම් රු.12,756,497 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ආ) ගිණුම්වලින් අත්හැරීම්**

පළාත් සභාවේ ක්‍රියාත්මක වන අත්තිකාරම් ගිණුම් කටයුතු පහකින් අත්තිකාරම් ගිණුම් හතරක ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

#### 1.2.2 විසර්ජන ගිණුම්වල වූ පොදු අඩුපාඩු

ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හෝ කොටසක් උපයෝජනය නොකිරීම, වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම, හිඟ බැරකම් ගිණුම්වලින් අත්හැරීම්, පුනරාවර්තන වියදම් මූලධන වියදම්වලට අය කිරීම මෙන්ම මූලධන වියදම් පුනරාවර්තන

වියදම්වලට අය කිරීම, මූලධන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම, ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් පැහැදිලි කිරීම් නොවීම හා දෙපාර්තමේන්තු පොත්පත් පළාත් භාණ්ඩාගාරයේ පොත්පත් සමඟ නොසැසඳීම වැනි නැවත නැවත සිදු වී තිබුණු පොදු අඩුපාඩු පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාළව සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම් සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

විගණනයේදී පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා කලින්කලට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් හා මුදල් කොමිෂන් සභාවෙන් ලැබෙන මුදල් චක්‍රලේඛ හා උපදෙස්වලට අනුකූලව අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

මෙම අඩුපාඩු වලට අමතරව, සමාලෝචිත වර්ෂයේ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පිළිබඳ විසර්ජන ගිණුම් විගණනයේදී පහත දැක්වෙන අඩුපාඩුද නිරීක්ෂණය විය.

(අ) තත්කාර්ය පදනම මත වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් විවිධ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වැය විෂය සංකේත කිහිපයක් යටතේ සලසන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් හෝ කොටසක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) විසර්ජන ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා දී තිබූ පළාත් භාණ්ඩාගාර උපදෙස් සමඟ අනුකූලවී නොතිබුණි.

(ඇ) ඉතිරිවීම් සඳහා දී තිබූ උපදෙස් සතුටුදායක හෝ ප්‍රමාණවත් නොවීය.

(ඈ) සැපයුම්, ඉන්ධන, විදුලි වියදම් ආදිය සම්බන්ධයෙන් රු.38,058,183 ක් වූ බැරකම් සඳහා ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශ 05 ක් හා දෙපාර්තමේන්තු 07 ක් විසින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.165,451,679 ක් වූ වියදම් දරා තිබුණි. අතිරික්ත වියදම් දැරීමෙන් පසුව පළාත් මුදල් රීති (පීඑෆ්ආර් ) 46 ප්‍රකාර අනුමැතිය ලබාගෙන තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂයයන් 10 කට අදාළව එකතුව රු.9,645,015 ක් වූ වර්ෂ 10 කට වැඩිපාඩු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(උ) එකතුව රු.27,199,678 ක් වූ පාඩු සම්බන්ධයෙන් පළාත් මුදල් රීති 61 සිට 74 ප්‍රකාර කටයුතු කර නොතිබුණු අතර එය පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ සත්ව

නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා විසර්ජන ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් රු.113,105 ක මුදලක් ගිණුම්වල බැරකම් ලෙස දක්වා තිබුණි.

(එ) නව වැය විෂයයන් ඇති කිරීමෙන් තොරව වැය ශීර්ෂ 19 ක් යටතේ රු.302,906,167 ක් වූ වියදම් දරා තිබුණි.
අධීක්ෂණ ක්‍රමය අනුගමනය කර තිබුණද, සමහර ඌනතාවයන් සිදුවූ බවත් ඉදිරියට ඒවා නිවැරදි කර ගන්නා බවත් ප්‍රධාන ලේකම් මේ සම්බන්ධයෙන් දක්වා තිබුණි.

(ඒ) විවිධ පළාත් දෙපාර්තමේන්තුවල මූලධන වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් විෂයයන් 110 ක් යටතේ දරන ලද රු.6,911,823 ක් වූ මූලධන වියදම පුනරාවර්තන වියදම යටතේ සාවද්‍යාව වර්ගීකරණය කර තිබුණි.

(ඔ) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ වත්කම් විශාල සංඛ්‍යාවක් අස්ථානගතවී ඇති බව වාර්තා වී තිබුණි. එහෙත් දෙපාර්තමේන්තු වැඩි ප්‍රමාණයක් මෙම නැතිවීම් සම්බන්ධයෙන් විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබූ අතර නැතිවීම් පිළිබඳ ප්‍රාථමික වාර්තා හා අවසාන වාර්තා පළාත් මුදල් රීති අංක 69 ප්‍රකාරව එම දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

**1.2.3 පොත් හා වාර්තා නොපැවත්වීම.**

**--------------------------------**

පළාත් සභාව විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබූ බවත් ඇතැම් වෙනත් ලේඛන විධිමත් හා යාවත්කාලීන ආකාරයෙන් පවත්වා නොතිබූ බවත් විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110, පළාත් මුදල් රීති අංක 259- 01 |

ඉදිරියේදී ලේඛන පැවැත්වීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන බවත් පැහැදිලි කර ගැනීම් ක්‍රියාවලිය සිදුකර ගෙන යන බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දක්වා තිබුණි.

**1.2.4 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල වූ අඩුපාඩු**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරුවී ගිය පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරින්ගෙන් සහ විශ්‍රාම ගිය, මියගිය , ව්‍යාපෘතිවලට මුදා හරින ලද, සේවය අතහැර ගිය හා වැඩ තහනම් කරන ලද නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.30,087,987 ක් වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් රු.4,170,290 ක් හා රු.91,498 ක් වූ හඳුනා නොගත් ශේෂ සහිතව සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

(ඇ) නිරවුල් නොකළ ණයවලට අදාළව අමාත්‍යාංශ 5 කින් හා දෙපාර්තමේන්තු 27 කින් අයවිය යුතු ලෙස මූලා‍ ප්‍රකාශනවල දැක්වෙන රු.610,063,838 ක් වූ හර ශේෂය සඳහා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් තථ්‍ය උපලබ්ධි මුදල එයින් නිරූපනය වන්නේද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

**1.2.5 හිඟ අග්‍රිම ශේෂ නිරවුල් කිරීම**

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.5,786,000 ක් වූ අග්‍රිම ශේෂ 2013 මාර්තු 28 දක්වා නිරවුල් නොකර පැවතුණි. මේ සම්බන්ධයෙන් අදාළ ආයතනයෙන් හිඟ අග්‍රිම අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ දෙපාර්තමේන්තුව විසින් රු.626,681 ක් වූ නිරවුල් නොකළ අග්‍රිම 2012 වර්ෂය අවසානයට පළාත් භාණ්ඩාගාරයට නිරවුල් කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

**1.2.6 වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවල අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පශු සම්පත් ගොවිපොළවල් පවත්වා ගැනීම - විෂය අංක 43202**

(i) පූන්තොට්ටම්, වෙක්කාඩිපුලවු හා අච්චුවේලි යන පශු සම්පත් ගොවිපොළවල ස්ථාවර වත්කම් වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ii) උතුරු පළාත් සභාවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා සේවක සංඛ්‍යාව, පළාත් සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නියම කර / අනුමත කර නොතිබුණි.

(iii) පළාත් මුදල් රීති 18.3 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුතුවල අපේක්ෂිත කාරක පාඩු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iv) පළාත් මුදල් රීති 18.3 ප්‍රකාරව පාඩු පිළිබඳ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 6 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) පේෂ කර්මාන්ත - විෂය අංක 47302**

(i) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 3 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 6 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,649,559 ක් වටිනාකම වූ අවසන් තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට දක්වනු වෙනුවට විකුණුම් වටිනාකමට දක්වා තිබුණි. තවද තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) එක් එක් මධ්‍යස්ථානයේ කාර්ය සාධනය තහවුරු කර ගනු සඳහා එක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් වෙනම ලාභාලාභ ගිණුමක් පිළියෙල කර නොතිබුණි.

(v) ඩයි වර්ග මිලට ගැනීම හා රෙදි විවීමේ මධ්‍යස්ථාන අතර බෙදා හැරීම සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි.

(vi) මිලදී ගන්නා අවස්ථාවේදී නිෂ්පාදනය සඳහා පැවති තොග ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙන් තොරව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව අතිරේක නූල් ප්‍රමාණයන් මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදනය සඳහා භාවිතා නොකළ නූල් මිලදී ගැනීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් උපයෝජනය කර තිබූ අතර එම නූල් ගබඩාවේ නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි. පළාත් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබානොදුන් බවත්, විකුණුම් ආදායමෙන් මෙහි කටයුතු කළමනාකරණය කර පවත්වා ගෙන යන බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයා දන්වා තිබුණි.

### 1.2.7 ආදායම් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් සංකේත හයක් සඳහා එකතුව රු.මිලියන 172 ක් වූ ඇස්තමේන්තුගත ආදායමක් අයවැයගත වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම් ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2013 වර්ෂය සිට ඉදිරියට ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා පියවර ගත් බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

(ආ) පළාත් සභාව විසින් ව්‍යවස්ථාවලින් අනුමත නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය ප්‍රකාර රජයේ නිල නිවාස පිළිබඳ කුලී, අත්තිකාරම් ගිණුම් මත පොලී, වාහන බලපත්‍ර ගාස්තු හා මුද්දර ගාස්තු ආදී රු.1,648,695,529 ක් වූ ආදායම්, පළාත් සභාවේ අරමුදල්වලට ගෙන තිබුණි.

**1.2.8** බැංකු සැසඳුම් ප්‍රකාශ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මාස 6 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ උපලබ්ධි නොවූ තැන්පතු රු.45,600 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසීම් කර පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) මාස හයකට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද රු.2,107,492 ක් වටිනාකම වූ චෙක්පත් 74 ක් සම්බන්ධයෙන් පළාත් මුදල් රීති 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන ලේකම් ලේකම් කාර්යාලය, කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව හා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ හඳුනා නොගත් හර රු.105 ක් හා හඳුනානොගත් බැර එකතුව රු.1,002,704 ක් නිරීක්ෂණය විය. මෙම හර හා බැර හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.2.9** පොදු තැන්පත් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව එක් එක් අර්ධ වර්ෂයක් අවසානයේදී කල් ඉකුත් වූ තැන්පතු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගිණුම්වල වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවා පැවති රු.86,175,791 ක් වූ තැන්පතු ශේෂ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ රු.20,965,636 ක් වටිනාකම වූ පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ හැකිව තිබූ නමුත් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) මුද්දර ගාස්තු , විශ්‍රාම අරමුදලට දායකය , ණය අයකර ගැනීම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකය සහ රඳවා ගැනීම් බදු ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.1,874,498 ක මුදලක් අදාළ ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(ඉ) සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් පාලන දෙපාර්තමේන්තුව, ක්‍රිඩා දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ මුලධන ප්‍රතිපාදන රු.88,471,799 ක් හා පුනරාවර්තන ප්‍රතිපාදන රු.31,098,274 ක් පළාත් මුදල් රීති 215(3) ට පටහැනිව වර්ෂය තුළ වැය නොකළ ප්‍රතිපාදන ලෙස තැන්පතු ගිණුම්වලට මාරුකර තිබුණු අතර 2013 ඔක්තෝබර් 31 දක්වා මෙම මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) එකතුව රු.2,233,912 ක් වු ව්‍යාපෘති 3 කට අදාළ අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(උ) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය ඇතුළු දෙපාර්තමේන්තු නවයක් විසින් විවිධ කාර්යයන් සඳහා ලද එකතුව රු.110,156,734 ක් වු අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 2 කට වැඩි කාලයක් තැන්පතු ගිණුම්වල තබා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **දෙපාර්තමේන්තුවේ නම** | **තැන්පතු වර්ගය** | **කාල පරිච්ජේදය (වර්ෂ)** | **මුදල** |
|---|---|---|---|---|
| | | | | රු. |
| i. | ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය | වාහන හා ඉඩම් මිලදී ගැනීම සහ රඳවා ගැනීම් මුදල් | වර්ෂ 3-4 ට වැඩි | 86,160,341 |
| ii. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | උපලබ්ධි නොවු චෙක්පත් කිලිනොච්චි පළාත් පාලන සහකාර කොමසාරිස් (R/ACLG) | වර්ෂ 2 - 3 ට වැඩි | 6,299,058 |
| iii. | කෘෂි කර්ම දෙපාර්තමේන්තුව | රේඛීය අමාත්‍යාංශයෙන් තැන්පතු, ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘති අරමුදලෙන් තැන්පතු සහ වෙනත් තැන්පතු | වර්ෂ 2- 3 ට වැඩි | 6,292,949 |
| iv. | කර්මාන්ත දෙපාර්තමේන්තුව | රඳවා ගැනීම් මුදල් | වර්ෂ 2- 3 ට වැඩි | 82,067 |

| | | | | |
|---|---|---|---|---|
| v. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | යතුරු පැදි ණය අයකර ගැනීම | වර්ෂ 2- 3 ට වැඩි | 995,925 |
| vi. | කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනය | සහතික පත්‍ර පාඨමාලා ගාස්තු | වර්ෂ 2- 3 ට වැඩි | 6,250 |
| vii. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | (i) පශ්චාත් උපාධි ඩිප්ලෝමා රඳවා ගැනීම් මුදල් | වර්ෂ 3 ට වැඩි | 15,450 |
| | | (ii) අවලංගු කළ චෙක්පත් - ජනාධිපති අරමුදල් ශිෂ්‍යත්ව | වර්ෂ 2 – 5 ට වැඩි | 5,127,403 |
| viii. | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | රඳවා ගැනීම් මුදල් | වර්ෂ 2- 3 ට වැඩි | 2,120,538 |
| ix. | ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව | රඳවා ගැනීම් මුදල් | වර්ෂ 2- 3 ට වැඩි | 3,056,753 |
| | | | | 110,156,734 |

(ඌ) ආහාර හා කෘෂිකර්ම සංවිධානය ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් විසින් ගොවීන් අතර නොමිලයේ බෙදාදීම සඳහා පරිත්‍යාග කරන ලද යතුරු පැදි කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සහනදායී මිලකට නිලධාරින්ට ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් යතුරු පැදි ප්‍රතිලාභීන්ගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 71.4 ක මුදලක් පළාත් ආදායමට බැර කිරිමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

### 1.2.10 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) බිල්පත්, ලදුපත්, ඇණවුම්, සනාථ කිරීම්, භාණ්ඩ ලැබීම්පත්, භාණ්ඩ නිකුත් කිරීම් පත් වැඩ නිම කිරීම් සහතික ආදී අවශ්‍ය සාක්ෂි නොවීම හේතුවෙන් පළාත් ආයතන 18 කට අදාළව ගිණුම්වල දැක්වෙන එකතුව රු.108,976,253 ක් වූ විෂයයන් 732 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කළ නොහැකි විය.

**(ආ) විගණනයට තොරතුරු ඉදිරිපත් කිරීම**

(i) පළාත් සභාවට අයත් වාහන කිහිපයක් සමාලෝචිත වර්ෂය තුළදී හා පෙර වර්ෂවලදී අනතුරුවලට භාජනය වී තිබුණද , එම වාහනවලට සිදුවූ අනතුරු

පිළිබඳ විස්තර හා අනෙකුත් විස්තර විගණනයට ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සේවක සංඛ්‍යා අවශ්‍යතාවය, බඳවා ගැනීම් යෝජනා ක්‍රමය , වයස් සීමා හා අධ්‍යාපන සුදුසුකම් සැලකීමෙන් තොරව පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා විවිධ පත්වීම් ලබාදී තිබුණද, එම පත්වීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර විගණනය සඳහා ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(iv) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම්, අන්තර් ග්‍රහණය කිරීම්, ස්ථිර කිරීම්, මාරු කිරීම් හා කොන්ත්‍රාත් පත්වීම් බොහෝ ගණනක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි. කෙසේ වුවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කමිටු රැස්වීම් වාර්තා විගණන පරික්ෂණය සඳහා ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

(v) ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අනුයුක්ත කරන ලද වාහන විස්තර සහ ඉන්ධන හා වාහන නඩත්තුව සඳහා දරන ලද වියදම විගණන පරික්ෂණය සඳහා ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් නොකරන ලදි.

(vi) පත් කිරීම් පදනම, රාජකාරි ලැයිස්තුව, මාසික ගෙවීම් විස්තර, සිදුකරන ලද උපදේශක සේවා විස්තර, පැමිණීම හා බඳවා ගැනීම් දිනය ආදී නීති උපදේශක පත් කිරීම සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි. අදාළ බඳවා ගැනීම් පරිපාටිය අනුගමනය කිරීම මගින් කොන්ත්‍රාත් පත්වීම් ලබාදී ඇති බවත්, නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත් නොවූ බැවින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ගෙවීමක් නියම කළ බවත් රාජකාරි වාහනයක් / ඉන්ධන නොසපයන බවත් මෙ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

(vii) රු.මිලියන 12.1 ක පිරිවැයකට විවිධ වැඩ මුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සම්බන්ධයෙන් 2013 පෙබරවාරි 13 දින පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු කැඳවූ නමුත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂය තුළදී පහත සඳහන් දෙපාර්තමේන්තුවලට නිකුත් කරන ලද විගණන විමසුම් නවයකට පිළිතුරු 2013 දෙසැම්බර් 31 දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර එම විගණන විමසුම්වලට අදාළ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.මිලියන 64.95 ක් විය.

| **අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව** | **විගණන විමසුම් සංඛ්‍යාව** | **මුදල** |
|---|---|---|
| | | **රු.මිලියන** |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 03 | 48.30 |
| ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 02 | 2.97 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 02 | 2.98 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 02 | 10.70 |
| | 09 | 64.95 |

**1.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

**(අ) පළාත් මුදල් රීති**

අංක 51, 69, 70, 70(5), 76, 105, 106, 107, 166, 172, 220(1), 237, 260(iii), 261, 301, 368, 407, 420(1) (v) (xiii) , 433,434(2), 434(5) සහ 434(6)

**(ආ) මධ්‍යම රජයේ ප්‍රතිපත්තිවලට පටහැනිව ආයතනික කරුණු ක්‍රියාත්මක කිරීම**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1999 ජුනි 01 දිනැති අංක පීඩී/බීපී/9 දරන චක්‍රලේඛයට අනුව පළාත් රාජ්‍ය සේවා නිලධාරින්ගේ ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු පිළිබඳ පරිපාටිවලට හැකිතාක් දුරට අනුකූල විය යුතුය.

එම විධිවිධානවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(i) එක් ලේකම්වරයකුට රු.150,000 ( දළ වශයෙන් ) බැඟින් වූ වටිනාකම ඇති ගෘහ භාණ්ඩ විෂයයන් සහිතව සම්පූර්ණයෙන් සකස් කරන ලද නිවාස ලබාගෙන පදිංචි වී සිටි ලේකම්වරුන් තිදෙනෙකුගෙන් නිවාස කුලී අයකර ගෙන නොතිබූ අතර, එම ලේකම්වරුන් පදිංචි වී සිටි නිවාස සඳහා විදුලි ගාස්තු හා ජල බිල්පත්ද පළාත් අරමුදලින් ගෙවා තිබුණි. රජයේ නිල නිවාසවල පදිංචිය සඳහා ලේකම්වරුන් ඇතුළුව සියළුම නිලධාරින්ගෙන් නිවාස කුලී හා ඔවුන් විසින් නිරවුල් කළ යුතු ජල බිල්පත් හා විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XIX පරිච්ජේදයේ 5.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

නිල නිවාස ලබාගැනීමට නොමැතිවීමත්, ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ පදිංචිය සඳහා ඔවුන්ගේ වැටුපෙන් රු.500 ක් අඩු කර ගැනීම මඟින් විශේෂ අනුමත නිවාස කුලියට ලබාගත් බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයා දන්වා තිබුණි.

(ii) විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2011 ජනවාරි සිට පළාත් සභාව විසින් ගොඩනැඟිලි 12 ක් කාර්යාල කටයුතු සඳහා කුලී පදනම මත ලබාගෙන තිබුණි. තවද 2011 සිට 2012 වර්ෂ තුළදී රු.මිලියන 15 ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් කුලී ගෙවීම පිළිබඳ තක්සේරුවක් ලබා ගෙන නොතිබුණි.

කාර්යාල ගොඩනැඟිල්ලක් ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් අදාළ ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීම මඟින් කාර්යාල කටයුතු සඳහා විශේෂ අනුමත නිවාස කුලියට ගත් බවත්, එම අවස්ථාවේදී තක්සේරු වාර්තාව

ක්ෂණිකව ලබාගැනීමට නොහැකිවූ බවත් දැනට එය නිවැරදි කර ඇති බවත් ප්‍රධාන ලේකම් මේ සම්බන්ධයෙන් දන්වා තිබුණි.

(iii) වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව, පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 10,655 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(iv) ප්‍රාදේශීය කොමසාරිස්වරු සඳහා සේවක සංඛ්‍යාව අනුමතවී නොතිබුණද, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන යළි සේවයට බඳවා ගන්නා ලද නිලධාරියකු කිලිනොච්චි, යාපනය හා වවුනියාව සඳහා ප්‍රාදේශීය කොමසාරිස්වරයකු වශයෙන් කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණි. 2011 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වාහන නඩත්තු, ඉන්ධන හා වෙනත් කාර්යාල නඩත්තු වියදම්වලට අමතර වශයෙන් රු.5,434,345 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ඔහුට ගෙවා තිබුණි. ප්‍රාදේශීය කොමසාරිස්වරු ගරු ආණ්ඩුකාරතුමා විසින් නිසි පරිදි පත් කරන ලද බවත්, කළමනාකරණ සහකරුවන්, රියැදුරු හා කාර්යාල සේවකයින්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලය පළාත් රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද බවත් මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් දන්වා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.910,610,794 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.721,712,394 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 1,632.3 ක පිරිහීමක් දැක්වුණි. රජයේ ප්‍රදාන රු.මිලියන 1,136.6 කින් අඩුවීම හා මුළු වියදම රු.මිලියන 830.6 කින් වැඩිවීම සහ බදු ආදායම රු.මිලියන 335.9 කින් වැඩිවීම එයට හේතුවී තිබුණි.

## 2.2 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ආදායම | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් විෂයයන් | | | | | | |
| බදු හා බදු නොවන ආදායම | 172 | 1,648.70 | 1,476.70 | 42.00 | 1,312.80 | (1,270.80) |
| රජයේ ප්‍රදාන | 12,383 | 9,733.20 | (2,649.80) | 11,717.20 | 10,870.70 | 846.50 |
| | 12,555 | 11,381.90 | (1,173.10) | 11,759.20 | 12,183.50 | 424.30 |

| වියදම | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 8,055 | 8,244 | (189) | 7,606 | 7,583 | 23 |
| වෙනත් | 2,274 | 2,411 | (137) | 2,162 | 2,124 | 38 |
| උප එකතුව | 10,329 | 10,655 | (326) | 9,768 | 9,707 | 61 |
| මූලධන වියදම | 2,054 | 1,637 | 417 | 1,949 | 1,754 | 195 |
| මුළු එකතුව | 12,383 | 12,292 | 91 | 11,717 | 11,461 | 256 |

**2.3 මෙහෙයුම් සමාලෝචනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු. මිලියන 12,292 ක් විය. එයින් සියයට 87 කින් පුනරාවර්තන වියදම නියෝජනය වූ අතර, සියයට 13 කින් මූලධන වියදම නියෝජනය විය. තවද, මුළු වියදමින් රු. මිලියන 8,244 ක් එනම්, සියයට 67 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබුණි.

(ආ) මෝටර් වාහන ආදායම් බලපත්‍ර යටතේ හිඟ ආදායම් නිශ්චය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.
පළාත් සභාව නොමැතිවීම හේතුවෙන් අදාළ මූල්‍ය ව්‍යවස්ථාවකින් තොරව ආදායම නිශ්චය කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී එයට අවධානය යොමු කරන බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

**2.4 උපයෝජනය නොකළ ප්‍රතිපාදන**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල වැය ශීර්ෂ 18 ක් යටතේ සලසන ලද එකතුව රු.205,522,846 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වැය ශීර්ෂ 18 ක් යටතේ ලබාගත් රු.302,742,166 ක් වූ පරිපූරක ප්‍රතිපාදන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

**2.5 බලය නොලත් වියදම**

දෙපාර්තමේන්තු 27 ක් විසින් එකතුව රු.88,987,137 ක් වූ මූලධන වියදම් ප්‍රතිපාදන නොමැතිව දරා තිබුණු අතර මෙම වියදම වර්ෂය අවසානයේ අධිභාර ගිණුම මඟින් විධිමත් කර තිබුණි.

**2.6 අයවැය පාලනය**

පරිපූරක ප්‍රතිපාදන 200 ක් මඟින් රු.1,625,921,528 ක් සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 31 ක් යටතේ අරමුදල් මාරු. කර තිබුණි. එබැවින් අයවැය ලේඛනය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් හඳුනා ගන්නා ලද මූල්‍ය අවශ්‍යතාවලට හා 2011 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුකූලව 2012 වර්ෂයේදී අයවැය ලේඛනය පිළියෙල කළ බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි. කෙසේ වුවද 2012 වර්ෂයේදී අධ්‍යාපනය, සෞඛ්‍ය හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා නිලධාරීන් 896 ක සංඛ්‍යාවක් අනපේක්ෂිතව බඳවා ගන්නා ලදි. එබැවින් ගෙවීම් සඳහා අතිරේක ප්‍රතිපාදනයක් වෙන්කරන ලද අතර, පරිපූරක ප්‍රතිපාදන සලසන ලදි. මීට අතිරේකව අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් සඳහා 2012 වර්ෂයේදී ද උතුරු පළාතේ නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් සඳහා කටයුතු කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මූලධන වැය යටතේද අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වැඩ සඳහා වියදම් දැරීමට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පරිපූරක ප්‍රතිපාදන ලබාදෙන ලදි.

## 2.7 පළාත් අරමුදල් උපයෝජනය

(අ) පළාත් සභාවේ සංවර්ධන වැඩ යෝජනා සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලද අරමුදල් හා ඒ මත දරන ලද තථ්‍ය වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විෂයය විස්තරය | ලැබුණු අරමුදල් | තථ්‍ය වියදම | ඉතිරිවීම් | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| (i) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,294,391,000 | 974,420,715 | 259,970,275 | 75 |
| (ii) | අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය (ESDP)/ TSEP | 144,000,000 | 125,000,000 | 19,000,000 | 87 |
| (iii) | උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (NRCP) | 870,000,000 | 748,536,992 | 121,463,008 | 86 |
| (iv) | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | 286,609,000 | 286,608,554 | 446 | 100 |
| (v) | පළාත් මාර්ග ව්‍යාපෘතිය (PRP) | 503,000,000 | 446,830,711 | 56,169,259 | 89 |
| (vi) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 294,000,000 | 208,920,530 | 85,079,470 | 71 |
| (vii) | දිළිඳු හිතකාමී ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය / එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) | 40,000,000 | 3,706,560 | 36,293,440 | 9 |
| (viii) | උතුරු පළාත් සභා නවෝදයා පාසැල් 1000 | 50,000,000 | 38,501,045 | 11,498,955 | 77 |
| (ix) | යාපනය, කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය | 85,000,000 | 10,099,050 | 74,900,950 | 12 |
| (x) | සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (HSDP) | 5,000,000 | - | 5,000,000 | නැත |
| (xi) | පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උතුරු පළාත් ව්‍යාපෘතිය | 15,000,000 | 132,493,283 | -27,506,717 | 82 |
| (xii) | ඉරණමඩු වාරිමාර්ග ව්‍යාපෘතිය | 200,000,000 | 2,964,442 | 197,035,338 | 2 |
| | | ---------------- | --------------- | --------------- | |
| | | 3,787,000,000 | 2,978,081,882 | 893,917,888 | |

සමාලෝචිත වර්ෂය තුළදී මූලධන වැඩ සඳහා ඉහත ප්‍රභවයන්ගෙන් ලද රු.මිලියන 894 ක් වූ අරමුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබූ අතර පළාත් සභාව විසින් පවත්වනු ලබන බැංකු ගිණුමේ තබා තිබුණි.

(ආ) 2011 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා රු. මිලියන 974.3 සිට රු. මිලියන 1,775.1 දක්වා බැංකු ශේෂ අඛණ්ඩව වැඩිවී තිබුණු අතර, මෙම කරුණ මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන්ද පෙන්වා දී තිබුණද, පොදු ජනතාවගේ ප්‍රතිලාභ උදෙසා මෙම මුදල් උපයෝජනය කිරීමට 2012 දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ රු. මිලියන 5 ක බැංකු ශේෂයක් කිසිදු කාර්යයකට යොදා ගැනීමෙන් තොරව තබා තිබූ අතර, වර්ෂ 5 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි.

(ඈ) රු.මිලියන 36.1 ක් හා රු. 171,154 ක් වූ මුදල් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව ස්ථාවර තැන්පත් ගිණුමේ හා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල් ජංගම ගිණුමේ තබා තිබුණි. ස්ථාවර තැන්පතුවෙන් ලද ආදායම හා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල් ගිණුමේ බැංකු ශේෂය ආණ්ඩුකාරවරයාගේ සිහිවීම් සටහනෙහි (Memorandum) සඳහන් කරන ලද පරිදි අරමුණු කළ කාර්යය සඳහා උපයෝජනය කළ බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

## 2.8 පළාත් සංවර්ධන සැලැස්ම

එකතුව රු.මිලියන 1,117.21 ක් වූ වැඩ යෝජනා 299 ක් නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව, වැඩ පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා සංඛ්‍යාව |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිම කරන ලද | 237 | 22 | 259 |
| සියයට 50 කට අඩුවෙන් නිම කරන ලද | 07 | - | 7 |
| සියයට 50 කට වැඩියෙන් නිම කරන ලද | 22 | - | 22 |
| ආරම්භ නොකළ | 11 | - | 11 |
| එකතුව | 277 | 22 | 299 |

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### 2.9.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

උතුරු පළාත් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට යෝජිත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පාසැල් හැර පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| වර්ගය | යෝජිත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 1,173 | 630 | 543 |
| සහාය කාර්ය මණ්ඩලය හා කණිෂ්ඨ ශ්‍රේණි | 26,047 | 23,851 | 2,196 |
| අනෙකුත් (අනියම් / තාවකාලික) | 1,109 | 696 | 413 |
| | 28,329 | 25,177 | 3,152 |

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික නිලධාරින් හා ප්‍රාදේශීය කොමසාරිස්වරුන් බඳවා ගැනීම සඳහා සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණද, සභාව විසින් පත් කිරීම් සිදු කර තිබු අතර, රු.861,540 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ආ) පාසැල් කාර්ය මණ්ඩල

| **වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු / (අතිරික්ත) සංඛ්‍යාව** |
| --- | --- | --- | --- |
| මූල් ගුරු ශ්‍රේණි | 1,129 | 604 | 525 |
| ගුරු ශ්‍රේණි | 13,984 | 13,003 | 981 |
| කනිෂ්ඨ සේවක ශ්‍රේණි | 1,222 | 598 | 624 |
| වෙනත් - අනධ්‍යයන | 905 | 659 | 246 |
| | 17,240 | 14,864 | 2,376 |

(i) උද්‍යාන සේවකයන්, කම්කරුවන්, ගණිත සම්පත් මධ්‍යස්ථාන නිලධාරින්, සේවාස්ථ උපදේශකවරුන්, ගුරු මධ්‍යස්ථාන කළමනාකරු සහ තාක්ෂණික නිලධාරින් සඳහා සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. කෙසේ වුවද එම සේවක වර්ගයන්ගෙන් සේවකයන් 36 ක් සේවක සංඛ්‍යා අනුමැතිය නොමැතිව සේවයේ යොදා ගෙන තිබුණි.

(ii) ගුරුවරුන් 468 ක් ප්‍රධාන ගුරුභවතුන් ලෙස කටයුතු කරමින් තිබුණි. මෙම පුරප්පාඩු පිරවීම සඳහා කිසිදු පියවරක් මේ සම්බන්ධයෙන් ගෙන නොතිබුණි.

### 2.9.2 අවිධිමත් පත් කිරීම් හා පාරිශ්‍රමික

පළාත් සභාවේ බඳවා ගැනීම් වැඩි ප්‍රමාණයක් කිසිදු විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව තත්කාර්ය පදනම මත සිදු කර තිබූ අතර, සමහර පත් කිරීම් දීප ව්‍යාප්ත සේවා හෝ පළාත් රාජ්‍ය සේවයෙහි අනුමත බඳවා ගැනීම් යෝජනා ක්‍රම විෂය සීමාව තුළ සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 මැයි 11 දිනැති අංක 9/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නැවත සේවයේ යොදවාගත් විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ට වැටුප් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් රු.මිලියන 3.3 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද මෙම කරුණ 2011 වර්ෂය සඳහා මාගේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද, 2011 වර්ෂයේ ගෙවා තිබූ රු.3,360,959 ක වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන නිලධාරීන් 4 දෙනෙකු පත්කර තිබුණි.

(ඇ) නීති උපදේශක ඇතුළු කොන්ත්‍රාත් පදනම යටතේ වූ නිලධාරීන් 9 දෙනෙකුට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පත්වීම් ලිපි නිකුත් කර තිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 ඡේදය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීම් ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව විශ්‍රාමික නිලධාරීන් 30 දෙනෙකු නැවත පත් කර තිබුණි.

(ඉ) පළාතේ වැඩි පළපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරුන් සිටියදී, බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අඩු පළපුරුද්ද සහිත ගණකාධිකාරිවරුන් ප්‍රධාන ගණකාධිකාරිවරුන් ලෙස පත්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස යහපත් මූල්‍ය පාලනය හා මූල්‍ය විනය එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අනුගමනය කිරීමට නොහැකි විය.

(ඊ) බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රධාන කළමනාකරණ ලිපිකරුවන් ලෙස කළමනාකරණ සේවයේ I පන්තියේ නිලධාරීන් වෙනුවට කළමනාකරණ සේවයේ III පන්තියට අයත් නිලධාරීන් පත් කර තිබුණි.

(උ) කළමනාකරණ සහකාර සේවයේ බොහෝ නිලධාරීන්ට වැඩ සටහන් සහකාරවරුන්ගේ රාජකාරි සිදුකිරීම සඳහා පවරා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය දීප ව්‍යාප්ත සේවයක් වුවද, 2007 පෙබරවාරි 11 දිනැති අංක එස්සීඑෆ්ආර් 320/2003 දරන නඩුවට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දී තිබූ තීන්දුව සැලකීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ගණකාධිකාරිවරුන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු පත්කර තිබුණි.

## 2.10 පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය සාධනය

පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**2.10.1 ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය**

**(අ) යාපනය සහ කොළඹ කාර්යාල සඳහා කුලී ගෙවීම**

ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ල 2011 වර්ෂය තුළදී රු.මිලියන 61.8 ක පිරිවැයකට අභිනවයෙන් ඉදිකර නිමකර තිබුණි. එසේ වුවද පළාත් මුදල් රීති 420.1 ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව යාපනය හා කොළඹ ක්‍රියාත්මක වන කාර්යාලවල කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.1,378,500 ක මුදලක් ගෙවා තිබුණි.

**(ආ) අත්තිකාරම් නිරවුල් කිරීමේ ප්‍රමාදය**

(i) විවිධ කාර්යයන් සඳහා ලබාගෙන තිබුණු එකතුව රු.7,851,188 ක තත්කාර්ය අත්තිකාරම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් මාස 01 සිට මාස 05 ක සැලකිය යුතු කාල ප්‍රමාදයන් අවස්ථා 24 කදී නිරීක්ෂණය විය.

(ii) නිලධාරීන් 8 දෙනෙකුට ගෙවන ලද එකතුව රු.245,000 ක තත්කාර්ය අත්තිකාරම් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව පසුව සම්පූර්ණයෙන් නිරවුල් කර තිබුණි. ඒ අනුව නිලධාරීන්ට ගෙවන ලද තත්කාර්ය අත්තිකාරම් සාවද්‍යාව පරිහරණය කළ හැකි විය.

(iii) පළාත් මුදල් රීති 219.2 හි දක්වා ඇති රු.50,000 ක උපරිම සීමාව ඉක්මවා තත්කාර්ය අත්තිකාරම් රු.90,000 ක් නිලධාරියෙකුට ගෙවා තිබුණි.

**(ඇ) ආණ්ඩුකාරවරයාට ගෙවන ලද ඉන්ධන දීමනා**

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛයට පටහැනිව මාසික ඉන්ධන දීමනාව රු.438,260 සිට රු.487,700 ක් දක්වා ආණ්ඩුකාරවරයාට ගෙවා තිබුණි. තවද රජයේ වාහනවලට සුපිරි පෙට්‍රල් සැපයීම සඳහා චක්‍රලේඛයේ විධිවිධාන නොමැති වුවද, සුපිරි පෙට්‍රල් හා සාමාන්‍ය පෙට්‍රල් වැනි විවිධ වර්ගයේ පෙට්‍රල් සඳහා ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ දක්වා ඇති උපයන විට ගෙවීම් බදු

යෝජනා ක්‍රමය ප්‍රකාරව ආණ්ඩුකාරවරයාට ගෙවා ඇති රු.50,000 ක අතිරේක මාසික ඉන්ධන දීමනා මත උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි.

**(ඈ) ගමන් වියදම් දීමනා ගෙවීම**

(i) ආණ්ඩුකාරවරයාගේ ප්‍රධාන කාර්යාලය යාපනයේ ස්ථානගතව හා උප කාර්යාල කිලිනොච්චි, වවුනියා හා කොළඹ ස්ථානගතව තිබුණද, යාපනයේ ගත කළ දිනයන් සඳහා ආණ්ඩුකාරවරයාට රු.76,750 ක් වූ ගමන් වියදම් ගෙවා තිබුණි.

ආරක්ෂක තත්ත්වයන් සැලකිල්ලට ගෙන කොළඹ උප කාර්යාලය රාජකාරි ස්ථානය ලෙස සැලකීම හේතුවෙන් කොළඹ සිට අදාළ පිට පළාත් සඳහා යෑමේදී ගමන්වලට අදාළව ගමන් වියදම් දීමනා ගෙවීමට සිදුවූ බව මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් දන්වා තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 12 ඡේදයට පටහැනිව නිලධාරින් තිදෙනෙකුට මාසිකව රු.30,000 බැගින් ගමන් වියදම් දීමනා ලෙස රු.960,000 ක මුදලක් ගෙවා තිබුණි. තවද මෙම නිලධාරින්ට නිල වාහන සපයා තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 12 ඡේදයට පටහැනිව රු.60,000 ක් වූ ගමන් වියදම් දීමනා කළමනාකරණ සහකරුට ගෙවා තිබුණි.

**(ඉ) ආණ්ඩුකාරවරයාගේ බැහැරයාම් සඳහා දිවයිනේ විවිධ හෝටල්වල නවාතැන් ගාස්තු නිරවුල් කිරීම**

ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 1.3 ඡේදයට පටහැනිව හෝටල් ගාස්තු ලෙස රු.141,138 ක මුදලක් පළාත් අරමුදලින් ගෙවා තිබුණි. මෙම බැහැරයාම් රාජකාරි හෝ පුද්ගලිකද යන්න පරීක්ෂා කිරීමට මේ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. 2012 නොවැම්බර් 05 දින ආණ්ඩුකාරවරයාගේ එක් දිනක් ගත කිරීම වෙනුවෙන් පුද්ගලික හෝටලයක කාමර දෙකක් සඳහා රු.79,288 ක මුදලක්ද වියදමට ඇතුළත් බව තවදුරටත් නිරීක්ෂණය විය. තවද බිල්පත්‍ර හෝ ඉන්වොයිසි නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි.

උපරිමව වැදගත් වූ ආරක්ෂක තත්ත්වයන් සැලකිල්ලට ගෙන වෙනත් ස්ථාන නොමැතිව ගරු ආණ්ඩුකාරතුමාට මෙම හෝටල්වලම නවාතැන් ගැනීමට සිදුවූ බව ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් මේ සම්බන්ධයෙන් දක්වා තිබුණි.

**(ඊ) විදේශීය අමුත්තන්ට සංග්‍රහ කිරීම සඳහා දරන ලද වියදම**

ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 03 ඡේදය ප්‍රකාරව සංග්‍රහ දීමනා මත වියදම් තේ, දිවා භෝජන හෝ රාත්‍රී භෝජනයට සීමා විය යුතු අතර ඒ සඳහා සත්කාරක ලෙස කටයුතු කරන නිලධාරියා හා ඔහුගේ කලත්‍රයා, අමුත්තන් හා ඔවුන්ගේ කලත්‍රයන් සහ තවත් පුද්ගලයන් පහකට නොවැඩි විය යුතු බව දක්වා ඇත. තවද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු අතර අනුමත කිරීමේ අධිකාරිය විසින් සැපයිය යුතු සංග්‍රහයේ ස්වභාවය හා ප්‍රමාණය තීරණය කළ යුතුය. ඉහත විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී රු.561,005 ක සංග්‍රහ වියදම් සිදුකර තිබුණි.

**(උ) දෙපාර්තමේන්තුවේ අරමුණුවලට පරිබාහිර වූ වියදම්**

අරමුණුවලට පරිබාහිර වශයෙන් වූ ගනුදෙනු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.2,451,466 ක වියදම් දරා තිබුණි. විස්තර පහත දැක්වේ.

(i) පලාලි කඳවුර ප්‍රදේශයේ ජාතික යුධ වීර දිනය සමරු උළෙල සම්බන්ධයෙන් වියදම රු.1,428,798 ක් විය.

(ii) ඓතිහාසික නල්ලූර් කන්දසාමි කෝවිලේ වාර්ෂික උත්සවය සැමරීම වෙනුවෙන් රු.790,000 ක වියදමක් දරා පුද්ගලික මුද්දර පත්‍රිකා හා කවර මුද්‍රණය කර තිබුණි.

**(ඌ) අනුමැතිය නොමැති ගෙවීම්**

පළාත් මුදල් රීති 166 යටතේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පෙර වර්ෂයට අදාළ එකතුව රු.153,044 ක වියදමක් දරා තිබුණි.

**(එ) බිල්පත්‍ර හා ඉන්වොයිසි නොමැතිව කරන ලද ගෙවීම්**

(i) ඉන්වොයිස් ලබාගැනීමෙන් තොරව අවස්ථා 23 කදී පළාත් මුදල් රීති 107 ට පටහැනිව එකතුව රු.697,921 ක ගෙවීම් කර තිබුණි.

(ii) දුරකථන බිල්පත් ලබාගැනීමෙන් තොරව ප්‍රතිපූර්ණයන් ලෙස එකතුව රු.54,527 ක ගෙවීම් පළාත් මුදල් රීති 107 ට පටහැනිව සිදුකර තිබුණි.

**(ඒ) සුඛසාධන විෂයයන් සැපයීම සඳහා දරන ලද වියදම්**

රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා රාජ්‍ය අරමුදල්වලින් සුභ සාධන විෂයයන් සැපයීමට රීති හා රෙගුලාසිවල විධිවිධාන නොමැති වුවද සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාල භාවිතය සඳහා මිලදී ගන්නා ලද සුභ සාධන විෂයයන් සඳහා රු.271,010 ක් වූ වියදම් දරා තිබුණි.

**(ඔ) වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම**

ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විසින් පළාත් මුදල් රීති 122 ප්‍රකාරව රු.918,103 ක වටිනාකම වූ ගෙවීම් වවුචර් 20 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඕ) ආණ්ඩුකාරවරුන්ගේ පසළොස් වැනි සම්මන්ත්‍රණය සඳහා දරන ලද වියදම**

ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය උතුරු පළාතේ පැවැත්වීම සඳහා පළාත් අරමුදලින් රු.21,547,806 ක මුදලක් වැයකර තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.මිලියන 21.5 ක පිරිවැයකට ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය පැවැත්වීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) සම්මන්ත්‍රණයට අදාළව දරන ලද වියදම් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළ නොවුවද එම වියදම්වලින් වැඩි ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂවලට අයකර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව වියදම් දරා තිබුණි.

(iv) ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන චක්‍රලේඛයේ (iii) ඡේදයට පටහැනිව නවාතැන් ගාස්තු හා හෝටල් ගාස්තු වශයෙන් පුද්ගලික හෝටල් තුනකට රු.1,024,320 ක මුදලක් ගෙවා තිබුණි.

(v) වියදම් සඳහා ඇස්තමේන්තු කිරීමෙන් තොරව හා අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව විවිධ පුද්ගලික පාර්ශවයන්ට අත්තිකාරම් විශාල ප්‍රමාණයක් ගෙවා තිබුණි.

**(vi) අත්තිකාරම් ගෙවීම**

යාපනයේ පුද්ගලික හෝටල් දෙකකට අත්තිකාරම් ලෙස රු.7,526,188 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වියදම් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව හා අදාළ පාර්ශ්වයන් සමඟ ගිවිසුමකට එළඹීමෙන් තොරව පුද්ගලික හෝටල්වලට අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය 2012 නොවැම්බර් මාසයේදී පවත්වා තිබුණද, ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණයට මාස 4 කට පෙර 2012 ජුලි මාසයේදී වටිනාකම රු.2,040,000 ක් වු අත්තිකාරම් ගෙවා තිබුණි.

**(vii) ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය පුද්ගලික හෝටලයක සංවිධානය කිරීම**

ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ 2001 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ජ්/පී 1/ 40 දරන චක්‍රලේඛයේ (iii) ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන විසින් ඔවුන්ගේ රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩ මුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතුය. කෙසේ වුවද ආණ්ඩුකාරවරුන්ගේ පසළොස්වැනි සම්මන්ත්‍රණය යාපනයේ පුද්ගලික හෝටලයක පවත්වා තිබුණු අතර අධි සුඛෝපභෝගී කාමර 30 ක් සඳහා සහ ආහාර පාන සැපයීම හා සංස්කෘතික සංදර්ශන සඳහා ගාස්තු ඇතුළත්ව දින දෙකක සම්මන්ත්‍රණය සඳහා එකතුව රු.2,965,943 ක වියදමක් දරා තිබුණි. තවද පළාත් ආණ්ඩුකාරවරුන් නව දෙනෙකු සම්මන්ත්‍රණයට සහභාගී වුවද අධි සුඛෝපභෝගී කාමර 30 ක් වෙන්කර තිබුණු බව නිරීක්ෂණය විය. උදේ ආහාරය සඳහා රු.1,450 ක්

බැගින්, තේ සඳහා රු.600 ක් බැගින්, දිවා ආහාරය සඳහා රු.2,600 ක් බැගින්, රාත්‍රී ආහාරය සඳහා රු.2,695 ක් බැගින් හා පෙරහුරු ගාස්තු රු.300,000 ක්, බස් කුලී ගාස්තු රු.60,000 ක් හා මැහුම් ගාස්තු රු.54,235 ක් වශයෙන් ඉතා ඉහළ රේටයන් එම වියදමට ඇතුළත් වී තිබුණි. ආරක්ෂක තත්ත්වය සැලකිල්ලට ගෙන ඒ හා සමාන තත්ත්වයේ වෙනත් ආයතනයක් නොවූ බැවින් ගරු ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ "ටිල්කෝ සිටි හෝටලය " තෝරා ගත් බවත්, කාමර (Suites ) ගරු ආණ්ඩුකාරවරුන්ට හා මෙම අවස්ථාවට විශේෂයෙන්ම සහභාගීවීම සඳහා ආරාධනා කරන ලද රේඛීය අමාත්‍යාංශවල විශේෂ ආරාධිතයන් හා මහා බැංකු අධිපතිවරයාට වෙන් කරන ලද අතර, ආහාර හා ආහාර පානවලින් සංග්‍රහ කරන ලද බවත්, ආණ්ඩුකාරවරුන්ගේ ලේකම් කාර්යාලවලින් ලබාගත් පූර්ව උපදෙස් ප්‍රකාරව ඉතා වැදගත් පුද්ගලයන් (VVIP) වෙනුවෙන් විශේෂ ආහාර වට්ටෝරු තෝරා ගත් බවත් ඒ අනුව වෙන්කර ගැනීම් සිදු කළ බවත් අනිකුත් පුද්ගලයන් සඳහා ආහාර, සංඛ්‍යාව හා ස්ථානික ආරාධිතයන් අනුව සීමා කරන ලද බවත් මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් දන්වා තිබුණි.

**(viii) හෙලිකොප්ටරයක් මඟින් ගමන් කිරීම වෙනුවෙන් දරන ලද වියදම**

---

දිවයින ඇතුළත ගමන් කිරීම සඳහා පොදු ප්‍රවාහන ක්‍රම තිබියදීත් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 05 ඡේදයට පටහැනිව දිවයින ඇතුළත ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෙලිකොප්ටරයක් යොදා ගනු වෙනුවට පුද්ගලික ගමන් මෙහෙයුම්කරුවකු වෙත රු.1,462,220 ක මුදලක් ගෙවා තිබුණි.

**(ix) ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා දැන්වීම් ප්‍රචාරණ වියදම්**

---

පසළොස්වැනි ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා දැන්වීම් ප්‍රචාරණ වියදම් ලෙස රු.502,872 ක මුදලක් ගෙවා තිබුණි. තවද රු.479,772 ක වියදම ශීර්ෂ 422 - සැලසුම් ලේකම් කාර්යාලය යටතේ අයකර තිබූ බව නිරීක්ෂණය විය.

**(x) සංස්කෘතික වැඩ සටහන සඳහා දරන ලද සංග්‍රහ වියදම**

---

ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූ තැනැත්තන් සඳහා 2012 නොවැම්බර් 15 දින පවත්වන ලද සංස්කෘතික වැඩ සටහන වෙනුවෙන්

පළාත් අරමුදලින් එකතුව රු.2,103,165 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල මේ සඳහා අයවැය ගත ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.

(ii) ඇස්තමේන්තු, මිල කැඳවීම්, භාරගත් බවට ලදුපත්, ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු, පිළිගැනීම් කළ ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් සඳහා භාවිතා කරන ලද නිම් ඇඳුම් තොගය ආදිය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) රු.80,000 ක් පිරිවැය වූ තල් කොළ වලින් සකස් කරන සාම්ප්‍රදායික තෙල් පහන ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණයේ එක් දිනක් සඳහා පමණක් යොදා ගෙන තිබුණි.

**(xi) පසළොස් වැනි ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා පොත් මුද්‍රණය කිරීම සඳහා දරන ලද වියදම**

---

ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණයට සහභාගී වූ තැනැත්තන් අතර බෙදාදීම සඳහා පොත් මුද්‍රණය කිරීම වෙනුවෙන් එකතුව රු.3,626,400 ක වියදමක් පළාත් අරමුදලින් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

(ii) ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණ සමරුව, උතුරු පළාතේ ජනතාවගේ සංස්කෘතිය, උතුරු පළාතේ ප්‍රස්ථාරික දර්ශනයන්, උතුරු පළාතේ කෘෂිකර්මය හා උතුරු වසන්තය සමරුව ආදී ප්‍රකාශන පිටපත් 1000 කට වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කර තිබුණි.

(iii) රු.මිලියන 3.6 කට පුද්ගලික මුද්‍රණකරුවන්ගෙන් මුද්‍රණ සේවාව ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

## 2.10.2 ප්‍රධාන ලේකම්ගේ, ලේකම් කාර්යාලය

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) නෙකෝර්ඩ් ( NECORD ) ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩවලට අදාළව කොන්ත්‍රාත්කරුට ගෙවන ලද තීරක ගාස්තු හා පොලිය**

වවුනියා මහ රෝහලේ මහල් හතරක බාහිර රෝගී අංශය (OPD) හා සායන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වු නෙකෝර්ඩ් ව්‍යාපෘතියට අදාළව කොන්ත්‍රාත්කරු හා පළාත් සභාව අතර ඇති වූ මතභේදය හේතුවෙන් රු.31,947,415 ක් වූ තීරක ගාස්තු හා පොලී ගාස්තු ගෙවා තිබුණි.

වාර්ෂික මුල්‍ය ප්‍රකාශන ( අයවැය ) අනුව, නෙකෝර්ඩ් ව්‍යාපෘතියේ කටයුතු උතුරු පළාත් සභාවේ විෂය පථයට අයත් නොවේ. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු හා උතුරු පළාත් සභාව අතර සිදුකරන ලද තීරක තීන්දුව පදනම් කර ගෙන පළාත් භාණ්ඩාගාරයේ ආපසු නොගෙවන තැන්පතු අරමුදලින් ගෙවීම සිදුකර තිබුණි. පළාත් භාණ්ඩාගාරයේ ආපසු නොගෙවන තැන්පතුවලින් කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| **ගෙවීම් ස්වභාවය** | **මුදල** |
|---|---|
| | රු. |
| කොන්ත්‍රාත්කරු ඉල්ලීම් කරන ලද මුදල | 14,674,882 |
| තීරක ප්‍රදානයේ ඉතිරි ගෙවීම් | 2,723,816 |
| ප්‍රධාන ලේකම්ගේ තීරක ගාස්තු | 2,482,181 |
| කොන්ත්‍රාත්කරුගේ තීරක ගාස්තු | 3,000,000 |
| කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් කරන ලද පොලී ගෙවීම | 7,305,550 |
| එකතු කළ අගය මත බදු | 1,760,986 |
| | 31,947,415 |

තීරක තීන්දුවට පෙර කොන්ත්‍රාත්කරු විසින් රු.14,674,882 ක මුදලක් ඉල්ලා සිටිය ද, ප්‍රධාන ලේකම්ට එරෙහි තීරක තීන්දුව පදනම් කර ගෙන කොන්ත්‍රාත්කරුට රු.31,947,415 ක් වු ගෙවීමක් කර තිබුණු බව තවදුරටත් නිරික්ෂණය විය. එහි

ප්‍රතිඵලයක් ලෙස පළාත් සභාවේ නිලධාරින්ගේ පාර්ශ්වයෙන් සිදුවූ පරිපාලන දූර්වලතා හේතුවෙන් රු.17,272,533 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් මෙසේ දක්වා තිබුණි. මෙම කාර්යයට අදාළ කොන්ත්‍රාත්තුව නිලධාරියකු වශයෙන් ප්‍රධාන ලේකම් විසින් අත්සන් කර තිබුණි. කෙසේ වුවද ක්‍රියාත්මක කරවීම හා කොන්ත්‍රාත් කළමනාකරණය නෙකෝර්ඩ් ව්‍යාපෘතියේ සේවය කරන ලද නිලධාරින් විසින් සිදුකර තිබුණි. එසේම අනාගතයේදී උතුරු පළාතේ කාර්යයන්හි කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ එවැනි ආකාරයේ පරිපාලන අඩුපාඩුකම් වළක්වා ගැනීම සඳහා වැදගත් පියවරයන් අප විසින් ගනු ලැබේ.

2.10.3 **පළාත් භාණ්ඩාගාරය**

(අ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව එකතු කළ අගය මත බදු සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් වාර්ෂික ඇස්තමේන්තුවල වෙනම ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින් පළාත් සභාවේ විවිධ ආයතන විසින් බාහිර පාර්ශ්වයන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු ගණනය කිරීමට පළාත් භාණ්ඩාගාරයට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව පළාත් සභාව විසින් මුලධන ප්‍රතිපාදනයෙන් ගෙවා තිබුණි.

වැය විෂය සංකේත 2501 යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG ) යටතේ එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා වෙන්කරන ලද බවත් පරිපූරක ක්‍රියාවලිය මඟින් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදනය සලසන ලද බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

**(ආ) අළුත් වැඩියා කළ නොහැකි වාහන 16 ක් වෙන්දේසි කිරීම**

උතුරු පළාත් සභාවට අයත්ව විකුණා තිබූ වාහන 16 ක් සමීක්ෂණ මණ්ඩල වාර්තාවල අළුත්වැඩියා කළ නොහැකි වාහන ලෙස දක්වා නොතිබුණු අතර වටිනාකම මත හා නියම කරන ලද රු.5,095,000 ක අවම මිල පදනම් කර ගෙන එම වාහන 16 ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් රු.5,412,232 ක මිලකට අපහරණය කිරීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද පරිපාලන අඩුපාඩු හේතුවෙන් එම වාහන වල හිමිකම් මාස 15 ක් ඉකුත් වීමෙන් පසුවත් ගැණුම්කරුවන්ට පවරා නොතිබුණි. පසුව

හිමිකම් මාරු කිරීමට අදාළ පොත් හා ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගැණුම්කරුවන් දෙදෙනෙකු විසින් ප්‍රධාන ලේකම්ට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් ගොනු කර තිබුණි.

**(ඇ) තිරුමුරුකන්ඩිහි නිවාස 75 ක් හා පෙර පාසැලක් ඉදිකිරීම සඳහා ගෙවීම**

තිරුමුරුකන්ඩිහි නිවාස 75 ක් හා පෙර පාසැලක් ඉදිකිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් 2012 ඔක්තෝබර් 18 දින කිලිනොච්චි, ආරක්ෂක බලකා අණදෙන නිලධාරි (Security Forces Commander ) හට රු.9,500,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) රු.මිලියන 10 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදනයක් සහිතව ශීර්ෂ 471 - පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවට වියදම අයකර තිබුණි.

(ii) පළාත් මුදල් රීති 787 ප්‍රකාරව, දෙපාර්තමේන්තුවල සියළුම ඉදිකිරීම් වැඩ ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට පැවරිය යුතු විය. කෙසේ වුවද ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ඉදිකිරීම් වැඩ ආරක්ෂක බලකායන්ට පවරා තිබුණි.

(iii) ග්‍රාම නිලධාරි හෝ ප්‍රාදේශීය ලේකම් මගින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදුකර තිබුණු බවට පරික්ෂා කිරීම සඳහා කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) ඇස්තමේන්තු හා ප්‍රමාණ පත්‍ර (BOQ) නොමැතිව ඉදිකිරීම් වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.

(v) නිවාස 75 ඉදිකිරීම ආරම්භ කළ බවට හා නිම කළ බවට දැක්වෙන කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. පළාත් දෙපාර්තමේන්තු විසින් ස්වාධීන පරික්ෂාවක් කර නොතිබුණු අතර ගෙවීම් සිදුකිරීමට පෙර නිම කරන ලද නිවාස සඳහා ඉංජිනේරු විසින් ඉදිරිපත් කරන ලද නිම කිරීම් වාර්තාව පරික්ෂා කර නොතිබුණි.

**(ඈ) සංවර්ධන කාර්යයන් සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් අණදෙන නිලධාරි "104 Plant Squadron SLE " හට ගෙවීම් කිරිම**

අණදෙන නිලධාරි හට ඉන්ධන සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,160,814 ක මුදලක් ඉන්ධන වියදම් ලෙස ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) උතුරු ප්‍රදේශයේ සංවර්ධන වැඩ සඳහා අණදෙන නිලධාරි "104 Plant Squadron SLE " හට ඉන්ධන සපයා තිබුණි. කෙසේ වුවද පළාත් අරමුදලින් රු.3,160,814 ක් වටිනා ඉන්ධන භාවිතා කිරීම මඟින් සිදුකරන ලද සංවර්ධන කාර්යයන් පිළිබඳ ස්වභාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පළාත් මුදල් රීති 430 ප්‍රකාරව, පෙට්‍රල්, තෙල් , ලිහිස්සි තෙල් ආදිය ඇණවුම් මත සැපයිය යුතුය. එහෙත් ඉන්ධන ඇණවුම් නොමැතිව රු.3,160,814 ක් වටිනා ඉන්ධන සපයා තිබුණි.

(iii) අණදෙන නිලධාරි විසින් යොදාගත් වාහනවලින් ධාවනය වූ කිලෝමීටර් ගණන හා වාහනවල ඉන්ධන පරිභෝජනය සහ ඉන්ධන පිරිවැය ගෙවීමේ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

එම අවස්ථාවේ පැවති ක්ෂණික හා ඉතා හදිසි තත්ත්වය සැලකිල්ලට ගෙන සහ මහජනයාට පානීය ජල පහසුකම සැපයීම සඳහා ගොඩබිම් ප්‍රදේශයේ ජලාශ අළුත් වැඩියා කිරීම ඉක්මන් කිරීම සඳහා වලන්තලායි ජලාශය හා යාපනය කොටුව අළුත් වැඩියා කළ බවත්, අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සම්බන්ධවීම මඟින් මෙම ක්‍රියාවලිය නිවැරදි කළ බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දක්වා තිබුණි.

**(ඉ) දූරකථන ගාස්තු ගෙවීම**

**-------------------------**

2012 මාර්තු 15 සිට 2012 අප්‍රේල් 14 දක්වා කාල පරිච්ඡේදය තුළ ජංගම දූරකථන 43 ක් භාවිතා කිරීම වෙනුවෙන් රු.157,447 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන චක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන් සැලකිල්ලට ගැනීමෙන් තොරව ආණ්ඩුකාරවරයාට වෙන්කර ඇති දූරකථනවලින් එක් ජංගම දූරකථනයක් භාවිතා කිරීම වෙනුවෙන් මසකට රු.75,670 ක විදේශීය සෘජු දූරකථන ඇමතුම් ගාස්තු ඇතුළත්ව රු.94,417 ක මුදලක් ගෙවා තිබුණි. තවද අදාළ නිලධාරියාගෙන් අතිරේක ගාස්තු ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළ දූරකථන ගාස්තු වියදම් පළාත් භාණ්ඩාගාරය විසින් ගෙවා තිබූ අතර දූරකථන වියදම් සීමාවන් සැලකිල්ලට ගැනීමෙන් තොරව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂයන්ට අයකර තිබුණි. කෙසේ වුවද අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් වියදම් සීමාව ඉක්මවා කරන ලද ගෙවීම් සඳහා ආපසු අයකර ගැනීම් සිදුකර තිබුණේද යන්න පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඊ) රු.මිලියන 42 ක සහතික නොකළ ගෙවීම**

පළාත් මුදල් රීති 107 ප්‍රකාරව ගෙවීම් වවුචරය සහතික කිරීමෙන් තොරව ගිලන් රථ 8 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් රු.මිලියන 42 ක ගෙවීමක් කර තිබුණි.

**(උ) ප්ලාස්ටික් ඇඳි පුටු 25 ක් මිලදී ගැනීම හා යාපනය, පොලිස් ස්ථානයට නිකුත් කිරීම**

ආණ්ඩුකාරවරයා දෙන ලද නියෝගය පදනම් කර ගෙන ප්ලාස්ටික් පුටු 25 ක් මිලදී ගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් රු.105,187 ක මුදලක් ගෙවා තිබුණු අතර යාපනය පෙලිස් ස්ථානයට නිකුත් කර තිබුණි. පොලිස් ස්ථානයේදී සාමාන්‍ය ජනතාවට පහසුකම් සැපයීම් සඳහා ගරු ආණ්ඩුකාරවරයාගේ උපදෙස් පදනම් කර ගෙන එම ප්‍රසම්පාදනය සිදුකළ බවත්, එය පළාත් භාණ්ඩාගාරයේ අරමුණුවලට පරිබාහිර බවත්, කෙසේ වුවද 2013 වර්ෂයේ සිට මෙවැනි කටයුතු අදාළ අමාත්‍යාංශ මඟින් සිදුකරන බවත් මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් විසින් ඔහුගේ පිළිතුර මඟින් දන්වා තිබුණි.

**2.10.4 පළාත් රාජ්‍ය පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) උතුරු පළාත් සභාවේ නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම**

(i) යාපනය සිට කිලිනොච්චි හා ත්‍රිකුණාමලය දක්වා නිලධාරීන්ට ගමන් කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට 2010 වර්ෂය තුළදී පළාත් සභාව විසින්

බස් රථ 3 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් බස් රථ තුනෙහි ගමන් කරන ලද නිලධාරින්ගෙන් එකතු කර ගත් ආදායමට වැඩියෙන් රු.4,721,336 ක මුදලක් වියදම් ලෙස දරා තිබුණි.

(ii) තවද පළාත් සභාව විසින් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2011 වර්ෂය තුළදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු අරමුදල් වලින් රු.මිලියන 32.2 ක පිරිවැයකට ඒ වන විටත් බස් රථ 10 ක් මිලදී ගෙන උතුරු ගමනාගමන මණ්ඩලයට බෙදාදී තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම බස් රථවල අයිතිය වර්ෂ දෙකක් ගතවීමෙන් පසුවත් උතුරු පළාත් සභාව වෙත පැවතුණි. එබැවින් පළාත් සභාවේ කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා පළාත් සභාව විසින් කිසිඳු පිරිවැයක් දැරීමෙන් තොරව මෙම බස් රථ භාවිතා කිරීමට උතුරු ගමනාගමන මණ්ඩලය සමඟ වැඩ පිළිවෙලක් සලසා ගෙන නොතිබුණි. එබැවින් බස් රථ 3 සඳහා දරන ලද රු.මිලියන 7.4 ක වියදම වළක්වා ගත හැකිව තිබූ වියදමක් ලෙස සැලකිය හැකිය.

(iii) සේවක මණ්ඩල ප්‍රවාහන සේවා සඳහා අයවැයගත ප්‍රතිපාදන නොමැතිව සේවකයන් ප්‍රවාහනයට අදාළ රු.4,721,336 ක වියදම අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය හා පළාත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වැය විෂයයන්ට අයකර තිබුණි.

(iv) පළාත් සභාවේ නිලධාරින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 4.72 ක පාඩුවකට බස් රථ 3 ක් යොදා ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාවේ හෝ වෙනත් එවැනි අධිකාරියකින් අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

උතුරු පළාතේ ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් ක්‍රමවත් ප්‍රවාහන සේවාවන් ලබානොදෙන බැවින්, ප්‍රමාණවත් පරිදි ආදායමක් රැස්කර ගැනීමට නොහැකි වුවද, කාර්ය මණ්ඩලයෙන් උපරිම සේවාව ලබාගැනීම සඳහා යාපනය සිට කිලිනොච්චි සහ ත්‍රිකුණාමලය දක්වා නිලධාරින්ට ගමන් කිරීම සඳහා උතුරු පළාත් සභාව විසින් ප්‍රවාහන සේවා සපයන බව මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

**2.10.5 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති දිවයිනෙන් බැහැරවී සිටි බැවින් 2012 ජූලි සිට 2012 සැප්තැම්බර් දක්වා මාස 3 ක කාල පරිච්ඡේදයක් තුළ කමිටු රැස්වීම්වලට සහභාගීවී නොතිබුණු නමුත් , රු.105,000 ක මුදලක් දීමනා ලෙස ඔහුට ගෙවා තිබුණි. මෙම කරුණ 2012 දෙසැම්බර් 17 දින නිකුත් කරන ලද මාගේ විගණන විමසුමෙන් පෙන්වා දී තිබුණද, සභාපතිට ගෙවන ලද අවිධිමත් ගෙවීම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.10.6 අධ්‍යාපන අමාත්‍යාංශය**

අමාත්‍යාංශයේ අරමුණුවලට පරිබාහිර ලෙස සැලකිය හැකි රු.මිලියන 4.47 ක පහත දැක්වෙන වියදම් අමාත්‍යාංශය විසින් දරා තිබුණි.

| වියදම් විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණය සඳහා වියදම | 2,064,758 |
| යුධ වීර දිනය | 341,780 |
| පළාත් සභා කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ඉන්ධන වියදම | 2,068,300 |
| | 4,474,838 |

**2.10.7 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිශ්චිත ප්‍රදාන උපයෝජනය**

2012 දෙසැම්බර් මාසයේදී පළාත් භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 195 ක මුදල අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| අරමුදල් වර්ගය | මුදල |
|---|---|
| | රු. |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 63,410,994 |
| නවෝදයා | 675,000 |
| යුනිසෙෆ් | 35,856,698 |
| පාසැල් අධ්‍යාපනය වෙනස් කිරීමේ උප ව්‍යාපෘතිය (TSEP) | 95,165,075 |
| එකතුව | 195,107,767 |

**(ආ) අදාළ නොවන රාජකාරි පැවරීම**

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු 126 ක් පැවතියද පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද මුල් ගුරු ශ්‍රේණි නිලධාරින්ට හා ගුරුවරුන්ට පසුගිය වර්ෂ කිහිපය සඳහා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරිවල නිරතවීමට අනුමත කර තිබු බවද නිරික්ෂණය විය.

**(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයට පත් කරන ලද ගුරුවරුන්ගේ හා අධ්‍යාපන සේවා නිලධාරින්ගේ (OES) වැටුප් ගෙවීම**

සමාලෝචිත වර්ෂය තුළදී ගුරුවරුන් 169 දෙනෙකු හා කාර්යාල සේවකයන් 16 දෙනෙකු සඳහා උතුරු පළාත් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් ලෙස ඔවුන් සේවයේ යෙදී නොසිටියද, වැටුප් ලෙස රු.මිලියන 57.9 ක මුදලක් පළාත් අරමුදලින් ගෙවා තිබුණි. එහෙත් පුත්තලම දිස්ත්‍රික්කය වයඹ පළාත් සභාවේ විෂය පථය යටතේ වන නමුත් පුත්තලම දිස්ත්‍රික්කය යටතේ ක්‍රියාත්මක වන පාසැල් හයක ඔවුන් වර්ෂ ගණනාවක් සේවය කර තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

(i) පළාත් මුදල් රීති 219 විධිවිධානවලට පටහැනිව මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරින් 07 දෙනෙකුට අවස්ථා 12 ක දී එකතුව රු.186,740 ක් වු තත් කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි.

(ii) පළාත් මුදල් රීති 219 විධිවිධානවලට පටහැනිව කාර්යය නිමවී මාස 09 ක් ගතවීමෙන් පසුව උප අග්‍රිම නිරවුල් කර තිබුණි.

(iii) පළාත් මුදල් රීති 219(2) ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියකුට එක් අවස්ථාවකදී උපරිමව ලබාදිය හැකි උප අග්‍රිමය රු.50,000 ක් විය යුතුය. කෙසේ වුවද රීතිවලට පටහැනිව එක් අවස්ථාවකදී සීමාව ඉක්මවා රු.200,000 ක උප අග්‍රිම නිලධාරියෙකුට ගෙවා තිබුණි.

**(ඉ) ගුරුවරුන් යෙදවීම**

පාසැල්වල විශේෂ විෂයයන් තිබෙන පුරප්පාඩුවලට අනුව ගුරුවරුන් විධිමත්ව යොදා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමහර පාසැල්වල අදාළ විෂයයන් සඳහා ගුරුවරුන්ගේ ඌනතාවයන් පැවති බව නිරීක්ෂණය වු අතර තවත් සමහර පාසැල්වල එම විෂයයන් සඳහා ගුරුවරුන්ගේ අතිරික්තයක් පැවතුණු බව නිරීක්ෂණය විය. ගුරුවරුන් අවිධිමත්ව යෙදවීම හේතුවෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ විභාග පිළිබඳ කාර්ය සාධනය ඉටුකරගෙන නොතිබුණි. විෂයයන් සඳහා පුරප්පාඩුවලට අනුව ගුරුවරුන් විධිමත්ව යෙදවුයේ නම් උසස් කාර්ය සාධනයක් ඉටුකර ගත හැකිව තිබුණි.

**(ඊ) රු. 210,240 ක වැඩිපුර ගෙවීම**

කිලිනොච්චි, ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලයේ පන්ති කාමර ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයන්ට වඩා ගොඩනැඟිලි ද්‍රව්‍ය අතිරික්ත ප්‍රමාණයන් මිලදී ගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.210,240 ක වැඩිපුර ගෙවීම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කිලිනොච්චි , ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලයේ ඉදිකරන ලද පන්ති කාමර ගොඩනැඟිල්ලේ අධීක්ෂණ ගාස්තු ලෙස රු.99,747 ක මුදලක් කිලිනොච්චි කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කාර්මික නිලධාරියාට ගෙවා තිබුණි. කෙසේ වුවද සිදුකරන ලද අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් කාර්ය නිම කිරීම් තහවුරු කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඍ) 2013 මැයි 22 දිනැති අංක 23 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව කිලිනොච්චි , ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලය විසින් ඇතුළත්වීමේ ගාස්තු ලෙස රු.1,075,850 ක මුදලක් සිසුන්ගෙන් අයකර ගෙන තිබුණි.

**(එ) පාසැල් සිසුන් 240 ක ගෙන් එකතු කර ගත් ඇතුළත්වීමේ ගාස්තු රු.මිලියන 2.4 ක් පිළිබඳ සාවද්‍ය පරිහරණය**

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී යා/හින්දු ප්‍රාථමික පාසැලේ සිසුන් 240 ක ගෙන් රු.මිලියන 2.4 ක මුදලක් එකතු කර තිබුණි. එකතු කරන ලද රු.මිලියන 2.4 ක මුදල පාසැල විසින් පවත්වනු ලබන බැංකු ගිණුමක හෝ පාසැල් සංවර්ධන සමිතියේ බැංකු ගිණුමක හෝ ගිණුම්ගත කර නොතිබූ බව තවදුරටත් නිරික්ෂණය . එහි ප්‍රතිඵලයක් ලෙස එකතු කර ගත් මුදල්වලින් කිසිඳු වියදමක් දරන ලද බවට කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එකතු කර ගත් රු.මිලියන 2.4 ක මුදල සාවද්‍යාව පරිහරණය කර තිබුණි.

**2.10.8 පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයට කිසිඳු ප්‍රතිලාභයක් අත්කර ගැනීමෙන් තොරව පහත දැක්වෙන ගෙවීම් අනාර්ථිකව සිදුකර ඇති බව නියැදි පරික්ෂණ වලදී අනාවරණය විය.

| **වියදම් විස්තරය** | **මුදල** |
|---|---|
| | **රු.** |
| කලර් නයිට් - ආලෝකකරණය | 36,250 |
| කාන්තා සාරි | 18,000 |
| ආණ්ඩුකාරවරයාගේ කාර්ය මණ්ඩලය සඳහා ක්‍රීඩා විෂයයන් මිලදී ගැනීම | 7,350 |
| නව වසරට ශුභ පැතුම් | 4,200 |
| වර්ෂය අවසාන රැස්වීමට ආහාරපාන | 9,500 |
| | 75,300 |

(ආ) පාපැදි 225 ක් බෙදාහැරීම සඳහා රු.229,000 ක වියදම දෙපාර්තමේන්තුවේ කටයුතුවලට අදාළ නොවුවද එම වියදම දෙපාර්තමේන්තුවට අයකර තිබුණි.

**2.10.9 පළාත් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව**

(අ) රත්මලානේ පිහිටි උතුරු පළාතේ සංචාරක බංගලා මුලධන වැඩ සඳහා රු.1,669,855 ක මුදලක් වැයකර තිබුණි. එම වියදම් විෂය ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතේ නොවුවද, එය ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වැය සඳහා සාවද්‍යාව අයකර තිබුණි. ( 461-15 -4-1303)

(ආ) ලී බඩු හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අදාළව රු.1,751,582 ක් වූ වියදම සමාලෝචිත වර්ෂය තුළ පොදු තැන්පත් ගිණුමට අයකර තිබුණි. පෙර වර්ෂයේදී ද ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය සඳහා ලී බඩු මිලදී ගැනීම වෙනුවෙන්වූ රු.මිලියන 7 ක එකම ස්වභාවයේ වියදම පළාත් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට අයකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ආණ්ඩුකාරවරුන්ගේ සම්මන්ත්‍රණයට අදාළ රු.98,662 ක වියදම අදාළ අධිකාරියෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ වැය විෂයයන්ට අයකර තිබුණි.

**2.10.10 පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**කිලිනොච්චි වෙළඳපොළ සංකීර්ණයේ තාවකාලික කඩසාප්පු ඉදිකිරීම**

රු.3,616,490 ක පිරිවැයකට තාවකාලික කඩ සාප්පු ඉදිකර පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයකර තිබුණි. ( වැය විෂය - 471-60-4-1303) මෙම වියදම් මුලධන ස්වභාවයේ වියදම්වලට සහ පළාත් පාලන ආයතනවලට අදාළව වුවද, ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් වියදම දරා වැය විෂය අංක 471-60-4-2202 වෙනුවට පුනරාවර්තන වැය විෂය අංක 471-60-4-1303 සඳහා සාවද්‍යාව අයකර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

**2.10.11 දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව**

(i) පොදු ජනයාට සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා 84 ක් විධිමත් අධීක්ෂණයක් හා ප්‍රමාණවත් ඖෂධ සැපයීමෙන් තොරව ක්‍රියාත්මක කරමින් තිබුණි.

(ii) ආයුර්වේද ඖෂධ සංවර්ධනය කිරීමට හා හර්බේරියමක් (Herbarium) ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද පුද්ගලික වෙළඳුන්ගෙන් හා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා දළ වශයෙන් රු.1,597,943 ක මුදලක් වැය කර තිබුණි.

**2.10.12 සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

වෛද්‍යවරුන් හා සහාය කාර්ය මණ්ඩලය නොමැතිවීම හේතුවෙන් සමහර රෝහල්වල ගොඩනැඟිලි හා වෛද්‍ය උපකරණ විශාල ප්‍රමාණයක් නිෂ්කාර්යව තිබුණි. එබැවින් මෙම ගොඩනැඟිලි හා උපකරණ සඳහා දරන ලද වියදම ඵල රහිත වියදම් ලෙස සැලකිය හැකි අතර මෙම වියදම් වලින් ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව කරා ලඟාවී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | ආයතන සංඛ්‍යාව | දැනට සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව | අනුමත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| යාපනය | 42 | 30 | 99 |
| මුලතිව් | 09 | 18 | 55 |
| කිලිනොච්චි | 13 | 22 | 62 |
| මන්නාරම | 16 | 44 | 89 |
| වවුනියා | 11 | 108 | 94 |
| | 91 | 222 | 399 |

උතුරු පළාතේ තිබෙන රෝහල් සංඛ්‍යාව 61 ක් වුවද, දන්ත ඒකක සඳහා අනුමත කාර්ය මණ්ඩලය 27 ක් පමණක් වූ අතර දන්ත රෝහල් සඳහා කාර්ය මණ්ඩලය වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| දන්ත ඒකක සඳහා වෛද්‍ය නිලධාරි | රෝහල් සංඛ්‍යාව | දැනට සිටින දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව | අනුමත කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| යාපනය | 26 | 18 | 09 |
| මුලතිව් | 06 | 05 | 03 |
| කිලිනොච්චි | 09 | 05 | 04 |
| මන්නාරම | 10 | 08 | 04 |
| වවුනියා | 10 | 10 | 07 |
| | 61 | 46 | 27 |

(i) මන්නාරම, කිලිනොච්චි හා යාපනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශවල එක් එක් රෝහල් සඳහා විශේෂඥ වෛද්‍යවරු සිටිය යුතුය. කෙසේ වුවද උතුරු පළාතේ රෝහල් වලට අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරු 51 ක සංඛ්‍යාවකින් 2011දෙසැම්බර් 31 දිනට 11 ක් පමණක් සේවයේ යෙදී තිබුණි.

(ii) උතුරු පළාතේ පාසැල් 1011 ක් ක්‍රියාත්මකව පැවතියද, පාසැල් දන්ත ඒකක 15 ක් පමණක් උතුරු පළාතේ ක්‍රියාත්මකව පැවතුණි.

(iii) පුනාකරි, ප්‍රාදේශීය රෝහලට අයත් ගොඩනැඟිල්ල සහිත අක්කර 5 ක ඉඩම් ප්‍රමාණයක් ආරක්ෂක හමුදා විසින් භාවිතා කරමින් තිබුණි. මෙම ගොඩනැඟිල්ල සෞඛ්‍ය කටයුතුවලට උපයෝජනය කිරීමට අදාළ අධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(iv) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ යටතේ ක්‍රියාත්මක වන විවිධ රෝහල්වල විශාල ප්‍රමාණයක කල් ඉකුත්වූ ඖෂධ තිබූ බව නිරීක්ෂණය විය. අදාළ අධිකාරීන් විසින් මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා මේ සම්බන්ධයෙන් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

**(v) ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු - රු.1,215,400**

වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල (අයවැය ලේඛනය ) පහත සඳහන් වියදම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද එම ගනුදෙනු අදාළ අධිකාරියෙන් ලබාගත් ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු බවද නිරීක්ෂණය විය.

| ගෙවීමේ ස්වභාවය | මුදල |
|---|---|
| | රු. |
| සෞඛ්‍ය සතිය වෙනුවෙන් ටී ෂර්ට්ස් සහ කැප්ස් සඳහා ගෙවීම | 357,500 |
| වීරසිංහම් ශාලාවේ සිට රෝහල්වලට වායු සමීකරණ යළි සවිකිරීම සඳහා ගෙවීම | 546,100 |
| පොත් 30 ක් මුද්‍රණය කිරීම සඳහා ගෙවීම | 73,800 |
| විස්තර පත්‍රිකා 200 ක් මුද්‍රණය කිරීම සඳහා ගෙවීම | 46,000 |
| මාසික කැලැන්ඩර් 600 ක් මුද්‍රණය කිරීම සඳහා ගෙවීම | 192,000 |
| | 1,215,400 |

**2.10.13 පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, යාපනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණ හා භාග ආහාරවේල සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් පහත දැක්වෙන රෝහල් සඳහා ආහාර රේටයන් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් රේටයන් විශ්ලේෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විශාල මුදල් ප්‍රමාණයක් වැඩිපුර ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| **විස්තරය** | **අලවෙඩ්ඩි** සම්පූර්ණ හා භාග ආහාර වේල් රේටයන් | **මානිපායි** සම්පූර්ණ හා භාග ආහාර වේල් රේටයන් |
|---|---|---|
| | රු. | රු. |
| අළුත් මාළු | 180 | 140 |
| හරක් මස් | 180 | 140 |
| කරවල | 180 | 140 |

| | | |
|---|---|---|
| එළවළු | 180 | 140 |
| බිත්තර | 180 | 140 |

## 2.11 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

සමාලෝචිත වර්ෂය තුළදී පළාත් සභාවේ භෞතික සම්පත් පහත විග්‍රහ කර ඇති පරිදි නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| | වත්කමේ ස්වභාවය | විස්තර | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i). | ගොඩනැගිලි | නිල නිවාස 85 | වටිනාකම ලබාගත නොහැක. |
| (ii). | වාහන | පික් අප් රථ 04 | -එම- |
| | | යතුරු පැදි 10 | -එම- |
| (iii). | යන්ත්‍රෝපකරණ | ජෙනරේටර් 02 | -එම- |
| | | පරිගණක 53 | -එම- |
| | | පරිගණක උපාංග 226 | -එම- |
| (iv). | කාර්යාල උපකරණ | ප්ලාස්ටික් පුටු 107 | -එම- |
| | | ලී බඩු විෂයයන් 126 | -එම- |
| (v). | රෝගී ඇඳන් | වඩ්ඩකච්චි රෝහලේ 70 ක් | -එම- |
| (vi). | ඇඳන්, පුටු, මෙට්ට ආදිය | කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ 198 ක් | 1,555,500 |

### (ආ) වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණය

(I) පහත දැක්වෙන පරිදි රු.53,228,247 ක් වටිනා වත්කම් 2012 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කර තිබූ අතර භෞතික සමීක්ෂණවලින් / භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් තහවුරු කර ගෙන නොතිබුණි.

මුදල

| | |
|---|---|
| | ------- |
| | රු. |
| ★ පශු සම්පත් ගොවිපළවල් නඩත්තු කිරීම | 47,442,801 |
| ★ පේෂ කර්මාන්ත | 5,785,446 |
| | ------------ |
| | 53,228,247 |

(II) 2012 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, දෙපාර්තමේන්තු 13 ක විෂයයන් 236 ක් අතිරික්තයන් ලෙස වාර්තා වූ අතර වාහන 3 ක් ඇතුළු විෂයයන් 118 ක් ඌනතාවයන් ලෙස වාර්තා විය. මේ සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් වාර්තා කරන ලද ඌනතා සහ අතිරික්තයන් පිළිබඳව පළාත් මුදල් රීති 68 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.12 හඳුනාගන්නා ලද පාඩු හා හානි

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මන්නාරම, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂට අයත් ගිලන් රථයක් 2003 දෙසැම්බර් 03 දින අනතුරකට භාජනයවී තිබුණි. වාහනයේ අළුත්වැඩියා පිරිවැය රු.695,700 ක් විය. වගකීම පැවරීම සඳහා අනතුර පිළිබඳ විමර්ශනයන් සිදුකර නොතිබුණු අතර පළාත් මුදල් රීති 104 ප්‍රකාරව මෙම පාඩුව සම්බන්ධයෙන් වාර්තාව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වාහනයක් 2011 ජුනි 11 දින අනතුරකට භාජනයවී තිබූ අතර අළුත් වැඩියා පිරිවැය රු.1,368,564 ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් රු.1,036,344 ක පිරිවැය පමණක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඉතිරි රු.332,220 පළාත් අරමුදලින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකීම පැවරීම සඳහා පළාත් මුදල් රීති 104 ප්‍රකාරව විමර්ශනයන් සිදුකර නොතිබුණි.

(ඇ) 1999 සිට 2011 කාලය තුළ සිදුවූ රු.56,418,312 ක පාඩු සම්බන්ධයෙන් පළාත් මුදල් රීති 70(5) ප්‍රකාරව අවසන් වාර්තා පළාත් දෙපාර්තමේන්තු පහක් විසින් ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

මුදල

------

| | රු. |
|---|---|
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 17,554,713 |
| වාරි මාර්ග දෙපාර්තමේන්තුව | 22,794,842 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 13,142 |
| සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 9,644,965 |
| කර්මාන්ත දෙපාර්තමේන්තුව | 6,410,650 |
| | 56,418,312 |

**2.13** **වාහන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, පළාත් සභාවේ තිබූ මුළු වාහන සංඛ්‍යාව 603 ක් වූ අතර සේවයේ යොදාගත් රියැදුරන් සංඛ්‍යාව 400 කට වඩා අඩු විය. රියැදුරන්ගේ විශාල හිඟය හේතුවෙන්, විවිධ දෙපාර්තමේන්තු සඳහා විවිධ සේවා සමූපකාර සමිතිවලින් බාහිරව ලබාගෙන තිබුණි.

(ආ) උතුරු පළාතේ තිබූ ගිලන් රථ 85 කින් ගිලන් රථ 7 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් අළුත්වැඩියා කිරීමෙන් තොරව නිෂ්කාර්යව තිබෙන්නට ඉඩ හැර තිබුණි. එම වාහන අළුත්වැඩියා කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) සමහර දෙපාර්තමේන්තු විසින් ඔවුන්ගේ නිල වාහනවලට අදාළව දෛනික ධාවන සටහන් හා මාසික කාර්ය සාධන වාර්තා, පළාත් මුදල් රීති 433 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ නියමිත දිනයන් තුළ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මන්නාරම, වවුනියා, කිලිනොච්චි හා මුලතිව් නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් වාහන බොහොමයක් වර්ෂ 1 සිට 5 දක්වා වූ කාලයක් අළුත්වැඩියා සඳහා ගරාජවලට භාර දී තිබුණි.

(ඉ) පෙර වර්ෂවලදී නැතිවූ ගිලන් රථ හතරක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුමය කටයුතු 2013 දෙසැම්බර් 31 දක්වා ගෙන නොතිබුණි.

(ඊ) සමහර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පළාත් මුදල් රීති 433 ප්‍රකාරව දෛනික ධාවන සටහන් විධිමත්ව පවත්වා නොතිබූ අතර රාජකාරි කටයුතු සඳහා බැහැරයාම් දෛනික ධාවන සටහන්වල සටහන් කර නොතිබුණි.

**(උ) රු.8,378,296 ක වාහන අළුත් වැඩියාව**

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන චක්‍රලේඛය ප්‍රකාරව ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට අනුයුක්ත කළ යුතු වාහන සංඛ්‍යාව 07 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලයට වාහන 20 කට වැඩි ප්‍රමාණයක් අනුයුක්ත කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී රු.8,378,296 ක පිරිවැයකට වාහන 17 ක් අළුත් වැඩියා කර තිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව වාහන අළුත් වැඩියා සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ii) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව රු.200,000 කට වැඩි වියදමක් දැරීම සඳහා අනුමැතිය අදාළ බලධාරින්ගෙන් ලබාගෙන නොතිබුණි.

(iii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව අළුත්වැඩියා සඳහා ගෙවීමට පෙර යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගෙන් සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(iv) පළාත් මුදල් රීති 107 ට පටහැනිව අවස්ථා 15 කදී මුල් ඉන්වොයිසි ලබාගැනීමෙන් තොරව අළුත්වැඩියා සඳහා ගෙවීම් කර තිබුණි.

(v) රු.110,532 සිට රු.1,306,840 දක්වා පිරිවැයකට නව වාහන 14 ක් සඳහා විශාල අළුත්වැඩියාවන් සිදුකර තිබුණි.

(vi) පළාත් මුදල් රීති 107 ප්‍රකාරව ඉන්වොයිසි ලබාගැනීමෙන් තොරව වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.511,790 ක ගෙවීමක් කර තිබුණි.

**2.14 ප්‍රසම්පාදන අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

(ආ) අනුමත ඇස්තමේන්තු හා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල සැඳහුම් දෙපාර්තමේන්තු කිහිපයක් විසින් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන පිළිබඳ වියදම විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5 වගන්තියට අනුව, ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන් තිදෙනෙකු සිටිය යුතු නමුත්, සාමාජිකයන් තිදෙනෙකුට වැඩි ගණනකට ගෙවීම් කර තිබුණි. ප්‍රසම්පාදන අත්පොතේ 2.9.1 වගන්තිය අනුව ප්‍රසම්පාදන කමිටු රැස්වීම් කාර්යාල වේලාවෙන් බැහැරව පැවැත්විය යුතුය. කෙසේ වුවද ප්‍රසම්පාදන කමිටුවේ සියළුම රැස්වීම් කාර්යාල වේලාව තුළ පවත්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 164.1 වගන්තිය ප්‍රකාරව අනුමත සමිතිවල මූල්‍ය හා භෞතික හැකියාවන් ඇගයීමෙන් තොරව ඉදිකිරීම් වැඩ එම සමිතිවලට ප්‍රදානය කර තිබුණි.

(ඉ) පළාත් සභාවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් විවිධ ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

**(ඊ) රු.11,880,000 කට "ගැල්වනයිස් අයර්න් වහල තහඩු " ප්‍රසම්පාදනය කිරීම**

සමාලෝචිත වර්ෂය තුළදී නැවත පදිංචි කළ ජනතාවගේ උපයෝජනය සඳහා ගැල්වනයිස් අයර්න් වහල තහඩු 12,000 ක් මිලදී ගැනීම වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරය විසින් රු.11,880,000 ක මුදලක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ඇස්තමේන්තුවල අයවැයගත ප්‍රතිපාදනයක් සලසා නොතිබීම හේතුවෙන් පළාත් භාණ්ඩාගාරය විසින් පරිපූරක ප්‍රතිපාදන මඟින් මෙම ගෙවීම් සිදුකර තිබුණි.

(ii) මිල කැඳවීම් 5 ක් ලබාගත යුතු වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව එක් මිල සැඳහුමක් පමණක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන තීරණය ගෙන ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

(iii) අදාළ ප්‍රභවයන්ගෙන් ඉල්ලීම්, බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ ලැයිස්තුව ප්‍රතිලාභීන් ලැයිස්තුව, නිකුත් කරන ලද තහඩු සංඛ්‍යාව සඳහා ලදුපත් සහ උපයෝජනය වැනි තොරතුරු විගණන පරික්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන්ට ආධාර සැපයීම සඳහා එම හදිසි හා ක්ෂණික තත්ත්වය සැලකිල්ලට ගෙන, මිල කැඳවීම් සිදුකිරීම මඟින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් කාර්යාලය විසින් මෙය සෘජුවම මිලදී ගෙන තිබුණු බවත්, බෙදාහැරීම සඳහා තෙලිප්පලෙයි හා සන්දිලිපායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වහල තහඩු භාරදුන් බවත්, කෙසේ වුවද 2013 වර්ෂයේදී මෙවැනි කටයුතු අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සිදු කෙරෙන බවත් මේ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

**(ඌ) ගිලන් රථ 8 ක් ප්‍රසම්පාදනය කිරීම**

සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාදේශීය රෝහල්වල උපයෝජනය සඳහා ගිලන් රථ 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරය විසින් රු.42,000,000 ක මුදලක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එකක් රු.මිලියන 4.7 ක පිරිවැයකට ගිලන් රථ 08 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන තිබුණි. කෙසේ වුවද එකක් රු.මිලියන 5.43 ක රේටයකට ගිලන් රථ මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2003 ජුලි 24 දිනැති අංක 112 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.මිලියන 5.85 ක අතිරේක වියදමක් ගිලන් රථ ප්‍රසම්පාදනය සඳහා දරා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ අයවැයගත ප්‍රතිපාදන නොමැතිව වැය ශීර්ෂ 451 - පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ මෙම වියදම අයකර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව මිල කැඳවීම් පහක් වෙනුවට එක් මිල කැඳවීමක් පමණක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන තීරණ ගෙන ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

**(ඍ) ට්‍රැක්ටර් 10 ක් හා ට්‍රේලර් 05 ක් ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රාදේශීය සභා මඟින් නැවත පදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ට්‍රැක්ටර් 10 ක් හා ට්‍රේලර් 05 ක් ප්‍රසම්පාදනය කිරීම වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරය විසින් රු.13,115,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ඇස්තමේන්තුවල අයවැයගත ප්‍රතිපාදන නොමැතිව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, පශු සම්පත්, ධීවර හා ඉඩම් අමාත්‍යාංශය යටතේ වියදම අයකර තිබුණි.

(ii) මිලදී ගන්නා ලද විෂයයන් බෙදාහැරීම පිළිබඳ විස්තර සහ විෂයයන් ලැබුණු බවට ලදුපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(එ) පොම්ප සමඟ ජල බවුසර් 15 ක් ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රාදේශීය සභා මඟින් නැවත පදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ජල බවුසර් 15 ක් ප්‍රසම්පාදනය කිරීම වෙනුවෙන් පළාත් භාණ්ඩාගාරය විසින් රු.4,425,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ඇස්තමේන්තුවල අයවැය ප්‍රතිපාදන නොමැතිව පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ මෙම වියදම අයකර තිබුණි.

(ii) මිලදී ගත් විෂයයන් බෙදාහැරීම පිළිබඳ විස්තර සහ විෂයයන් ලැබුණු බවට ලදුපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඒ) පරිගණක හා ඡායා පිටපත් යන්ත්‍ර ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව මිල කැඳවීම් තුනක් පමණක් පදනම් කර ගෙන පරිගණක 11 ක් හා ඡායාපිටපත් යන්ත්‍ර 03 ක් සහ වෙනත් මූලධන විෂයයන් රු.7,706,150 ක වටිනාකමට මිලදී ගෙන තිබුණි.

**(ඕ) යාපනය දිස්ත්‍රික්කය සඳහා 8'x6' ප්‍රමාණයේ දැන්වීම් පුවරු (Hoardings) 111 ක් රු.10,010,900 කට ප්‍රසම්පාදනය කිරීම**

---

සමාලෝචිත වර්ෂය තුළ යාපනය දිස්ත්‍රික්කය සඳහා දැන්වීම් පුවරු (Hoardings ) 111 ක් සෑදීම සඳහා රු.10,010,900 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවට වැය ශීර්ෂ 430, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වියදම අය කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට පටහැනිව මිල කැඳවීම් 5 ක් වෙනුවට මිල කැඳවීම් තුනක් පමණක් පදනම් කරගෙන ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.3 වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. කාලය සීමා කිරීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබානොගත් බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ සම්බන්ධයෙන් දක්වා තිබුණි.

(ඈ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (අයවැය) අනුව ගනුදෙනුව පිළිබඳ කාර්යයන් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ නොවූ අතර දිවි නැගුමට අයත් කාර්යයන් විය. කෙසේ වුවද පළාත් අරමුදලින් ලබාගන්නා ලද සැලකිය යුතු ප්‍රමාණයක මුදල් උපයෝජනය කරමින් දිවි නැගුම ව්‍යාපෘතියේ විවිධ කාර්යයන් සිදුකර තිබුණි.

(ඉ) යාපනයේ සැපයුම්කරුවන්ගෙන් ජීඅයි පයිප්ප සමඟ එක් පුවරුවකට පිරිවැය රු.40,000 ට වඩා අඩු වුවද, හෝකන්දර පුද්ගලික සමාගමක සැපයුම්කරුවකුගෙන් එක් පුවරුවකට රු.87,500 බැගින් ප්‍රසම්පාදනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත ගණුදෙනුව මත රු.4,162,500 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

**(ඕ) පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් වාර්තා කරන ලද නිරවුල් නොවූ කරුණු**

(I) පෙර වර්ෂය තුළ සිදුකරන ලද පහත සඳහන් ප්‍රසම්පාදනයන් පිළිබඳව පෙන්වා දෙන ලද අක්‍රමිකතා රාශියක් නිවැරදි කර ගැනීමට අදාළ අධිකාරින් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) රු.9,100,000 කට ලැප්ටොප් 100 ක් මිලදී ගැනීම

(ii). රු.6,145,688 කට පුද්ගලික ආයතනයකට ( වීරසිංහම් ශාලාව) වායු සමීකරණ සවි කිරීම

(iii) ට්‍රැක්ටර් ටිපර් ට්‍රේලර්ස් 15 ක් හා බවුසර් 20 ක් රු.8,575,000 කට ප්‍රසම්පාදනය කිරීම.

(iv) නව ටොයෝටා මෝටර් රථය ප්‍රසම්පාදනය කිරීම - රු.9,950,000

(v) රු.8,859,500 කට පාපැදි 700 ක් මිලදී ගැනීම

(vi) රු.32,200,000 කට බස් රථ 10 ක් ප්‍රසම්පාදනය කිරීම.

(vii) නිවාස ඉදිකිරීම සඳහා ගෙවීම් - රු.59,400,000

(viii) ගැල්වනයිස් අයර්න් වහල තහඩු ප්‍රසම්පාදනය කිරීම- රු.18,400,800

(ix) ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය කිරීම - රු.7,006,430

(x) නැවත පදිංචි කළ පවුල්වලට ජල ටැංකි (10001) 70 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.894,000

(xi) යාපනය දිස්ත්‍රික්කය සඳහා 8' x 6' ප්‍රමාණයේ දැන්වීම් පුවරු 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.865,000

(xii) ජල පොම්ප 200 ක් උපාංග සහිතව ප්‍රසම්පාදනය කිරීම - රු.6,580,000

(xiii) නැවත පදිංචි කළ ගොවීන් සඳහා කෘෂිකර්ම අත්පොත මුද්‍රණය කිරීම සඳහා ප්‍රසම්පාදනය - රු.1,152,000

(xiv) ටොප් ලැන්ඩ් හෙවි ඩියුටි ඩීසල් පොම්ප 05 ක් හා උපාංග ප්‍රසම්පාදනය කිරීම - රු.4,755,000

(xv) කොම්බයින් හාවස්ටර්ස් ( Model 41Z-2-0) 10 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.15,300,000

(xvi) KVA ජෙනරේටර් 100 ක් ප්‍රසම්පාදනය කිරීම - රු.2,647,128

(xvii) පැරණි උද්‍යානය සංවර්ධනය පිළිබඳ වියදම - රු.10,857,486

**(II) පළාත් අරමුදලින් තාවකාලික කඩ සාප්පු අයිතිකරුවන්ට ගෙවන ලද රු.600,000 ක වන්දි ගෙවීම ආපසු අයකර නොගැනීම**

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට පටහැනිව 2011 වර්ෂය තුළ තාවකාලික කඩ සාප්පු අයිතිකරුවන් 6 දෙනෙකුට උතුරු පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.600,000 ක මුදලක් ගෙවා තිබුණි. තවද, වාර්ෂික ඇස්තමේන්තුවේ අයවැය ගත ප්‍රතිපාදන නොමැතිව ඉහත වියදම වැය විෂය අංක 471-60-4-1901 යටතේ අය කර තිබු බව නිරීක්ෂණය විය.

**(III) යළි සේවයට බඳවා ගන්නා ලද නිලධාරින්ට වැඩිපුර වැටුප් ගෙවීම - රු.3,360,959**

---

2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත යළි සේවයට බඳවා ගන්නා ලද විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ට වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 වර්ෂය තුළදී රු.3,360,959 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**(IV) ප්‍රාදේශීය රෝහල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය (MOH) ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් ප්‍රමාණයක් අත්පත්කර ගැනීම - රු.මිලියන 3.75**

---

කිලිනොච්චි, පූනාකරිහි විශාල ප්‍රමාණයක රජයේ ඉඩම් තිබුණද, පූනාකරි වෛද්‍ය නිලධාරි කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා අක්කර 15 ක ඉඩමක් අත්පත් කර ගැනීමට පළාත්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2011 දෙසැම්බර් 31 දින රු. මිලියන 3.75 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද 2010 අගෝස්තු 07 දින පොදු ජනතාව විසින් පරිත්‍යාග කරන ලද අක්කර 5 ක ඉඩමක් දැනටමත් දෙපාර්තමේන්තුව සතුව තිබුණි. අත්පත් කර ගන්නා අවස්ථාවේදී අක්කර 1 ක වෙළඳ පොළ වටිනාකම රු.200,000 ක් පමණක් විය. තවද මෙම ගෙවීම සිදුකිරීමට පෙර තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස රු.750,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. අක්කර 1 කට අඩු ප්‍රමාණයක ඉඩමේ පමණක් ගොඩනැඟිල්ල ඉදිකර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

**(V) රු.මිලියන 2.887 ක් වූ අරමුදල් සාවද්‍ය පරිහරණය**

මිලදී ගැනීම් පිරිවැය මත සියයට 50 ක සහනදායි වට්නාකමට ජල පොම්ප 570 ක් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත නිකුත් කර තිබුණි. ජල පොම්ප 570 කින් ජල පොම්ප 264 ක් පමණක් ගොවීන් සඳහා බෙදාදී තිබුණි. මේ සම්බන්ධයෙන් 2011 අගෝස්තු 15 සිට සැප්තැම්බර් 12 දක්වා ගොවීන්ගෙන් එකතු කරගත් රු. මිලියන 2.887 ක මුදල රජයේ ගිණුමට ප්‍රේෂණය කරනු වෙනුවට පුද්ගලික බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලික බැංකු ගිණුමක තැන්පත් කිරීම හේතුවෙන් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් අරමුදල් සාවද්‍යව පරිහරණය කර තිබුණි.

## 2.15 අරමුණු ඉටු කර ගැනීම

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

පළාත් රාජ්‍ය සේවය සඳහා සුදුසු පුද්ගලයන් බඳවා ගැනීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ විය. කොමිෂන් සභාවේ නිලධාරියකු විසින් සමාලෝචිත වර්ෂය තුළදී බඳවා ගැනීම් යෝජනා ක්‍රම 41 ක් පිළියෙල කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සුදුසු නිලධාරින් බඳවා ගැනීමට මෙම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.16 විදේශ මුල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

**(අ) පළාත් මාර්ග ව්‍යාපෘතිය**

(i) ව්‍යාපෘති ගිවිසුම අනුව, කිලෝමීටර් 100 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් මාර්ග ඉදි කිරීම් පැකේජ 7 ක් රු. මිලියන 2,660 ක පිරිවැයකට සම්පූර්ණ කළ යුතු විය. කෙසේ වුවද, රු.මිලියන 1,515.4 ක කොන්ත්‍රාත් වටිනාකමකට මුළු දිග ප්‍රමාණය කිලෝ මීටර් 55 ක් වූ මාර්ග පැකේජ 4 ක මාර්ග වැඩ පමණක්

ව්‍යාපෘති කාර්යාලය විසින් ආරම්භ කර තිබුණු අතර කිලෝ මීටර් 45 ක දිගින් යුත් අනෙක් මාර්ග පැකේජ 3 හි කොන්ත්‍රාත් වැඩ, මුල්‍ය ගිවිසුම අත්සන් කර මාස 8 ක් ඉක්මවී ගොස් තිබුණද කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කර නොතිබුණි. ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වල මුළු වටිනාකම රු. මිලියන 1,697.2 (වැට් ඇතුළත්ව) ක් වීම හේතුවෙන් හා අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉතිරි කිලෝමීටර් 45 සඳහා ප්‍රසම්පාදන සිදුකිරීමට නොහැකි වූ බව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දන්වා තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රු.558,130,986 ක මුදලක් අග්‍රිම ලෙස ලැබී තිබුණද, ගිණුම් පොත් අනුව මෙම කාල පරිච්ඡේදය සඳහා දරන ලද වියදම රු.234,089,574 ක් පමණක් විය. එබැවින් 2011 දෙසැම්බර් 31 දිනට රු.346,653,804 ක් වූ විශේෂ (ඩොලර්) ගිණුමේ ශේෂය ව්‍යාපෘති කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(i) පහත දැක්වෙන කාර්යයන් ඉටුකර නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත් දෙකක් නවතා තිබුණි.

(අ) අවශ්‍ය ඉලක්කය සම්පූර්ණ කර ගැනීමේ අඩුපාඩු.

(ආ) වැඩබිමේ බලය නොලත් / අනුමැතිය නොලත් ද්‍රව්‍ය තොග ගොඩගසා තිබීම.

(ඇ) වැඩබිම් රසායනාගාරය ස්ථාපිත නොකිරීම.

(ඈ) අවශ්‍ය ප්‍රධාන කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් වැඩබිමේ ස්ථානගත නොකිරීම.

(ඉ) සැලසුම් / නිර්මාණ සම්පූර්ණ නොකිරීම.

(ඊ) වැදගත් ප්‍රභවයන් සඳහා නීතිමය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම.

(උ) ව්‍යාපෘතියට අදාළ කටයුතු සඳහා වැඩ පූර්ව අත්තිකාරම් උපයෝජනය කිරීම වෙනුවෙන් ලිඛිත සාක්ෂි සැපයීමට නොහැකි වීම.

උපදේශකවරයාගේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම හා ප්‍රමාණවත් අධීක්ෂණ ක්‍රියාවලියක් නොමැතිවීම හේතුවෙන් මාර්ග වැඩ නැවැත්වීමට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) 2012 දෙසැම්බර් 31 දක්වා අධීක්ෂණ උපදේශකවරයාට රු.61,546,563 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අධීක්ෂණ උපදේශකවරයා විසින් කොන්ත්‍රාත්තු දුර්වල ලෙස කළමනාකරණය කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂය තුළදී කිලෝමීටර් 26.4 ක දිගින් යුත් මාර්ග පැකේජ් දෙකක වැඩ නවතා තිබුණි. කිලෝමීටර් 29.3 ක්වූ ඉතිරි පැකේජ දෙකෙහි ප්‍රගතිය ඉලක්කයට වඩා ඉතා පිටුපසින් විය.

(ආ) උපදේශක කාර්ය මණ්ඩලයේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදායී නොවූ කොන්ත්‍රාත් පරිපාලනය , සන්නිවේදනය හා සැලසුම් නිර්මාණය හේතුවෙන් වෙනත් කණ්ඩායම් ප්‍රධානියකු පත්කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් වැඩ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීය.

(ඈ) විචලන නියෝග , කාලය දීර්ඝ කිරීම , සැලසුම් සංශෝධන හා නියමිත වැඩ සඳහා අනුමැතිය බොහෝ ප්‍රමාද වී තිබුණි.

(ඉ) උපදේශක හා ඔහුගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ වෘත්තීය වගකීම නොමැති වී තිබුණි.

(iii) අවිධිමත් ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් සංශෝධිත ප්‍රමාණයන්ට වඩා විශාල අතිරේක ප්‍රමාණයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | කොන්ත්‍රාත් අංක IRP/NP/01 | | | | කොන්ත්‍රාත් අංක IRP/NP/02 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සමුච්චිත ප්‍රමාණ පත්‍ර ප්‍රමාණය | සමුච්චිත සංශෝධිත ප්‍රමාණය | අතිරේක ප්‍රමාණය | වැඩිවීමේ ප්‍රතිශතයේ ප්‍රමාණය | සමුච්චිත ප්‍රමාණ පත්‍ර ප්‍රමාණය | සමුච්චිත සංශෝධිත ප්‍රමාණය | අතිරේක ප්‍රමාණය | වැඩිවීමේ ප්‍රතිශතයේ ප්‍රමාණය |
| ශුද්ධ කිරීම හා බිම සැකසීම | 22,862 | 51,196 | 28,334 | 124 | 55,719 | 62,822 | 7,103 | 13 |
| උප පදනම | 3,276 | 4,398 | 1,122 | 34 | - | - | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඒ.බී.සී | 16,099 | 17,816 | 1,717 | 11 | - | - | - | - |
| ඉවුරු වර්ගය (Embankment Type) | 1,540 | 7,807 | 6,267 | 407 | 3,630 | 10,950 | 7,320 | 202 |
| උරහිස (shoulder) | 3,007 | 3,758 | 751 | 25 | 4,810 | 5,504 | 694 | 14 |

(iv) ව්‍යාපෘති කළමනාකරණ වාර්තාවේ ඇගයීම පදනම් කර ගෙන කොන්ත්‍රාත් නිම කිරීම සඳහා කාලය දීර්ඝ කිරීමට නිර්දේශය පිළිවෙලින් කැලෙන්ඩර් දින 123 කින් හා දින 70 කින් ලබාදී තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුවන්ගේ පාලනයෙන් බැහරවූ කාලය දීර්ඝ කිරීම සඳහා වලංගු හේතු හෝ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කාලය දීර්ඝ කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **කොන්ත්‍රාත් අංකය** | **කොන්ත්‍රාත්තුව නිම කළ යුතු මුල් දිනය** | **1 සංශෝධනය** | **2 සංශෝධනය** | **3 සංශෝධනය** |
|---|---|---|---|---|
| NP/01 | 2012 ජනවාරි 27 | 2012 ජුලි 17 | 2013 මැයි 05 | 2013 අගෝ. 31 |
| NP/02 | 2011 නොවැ. 29 | 2012 මැයි 15 | 2011 ජුලි 06 | 2013 මැයි 20 |

(v) අරමුදල් නියෝජිතායතනයෙන් / පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනය හා ප්‍රමාණ පත්‍ර විෂයයන් සංශෝධනය සිදුකර තිබුණි.
කොන්ත්‍රාත් වටිනාකම් සංශෝධනය කර තිබුණද, සංශෝධන සඳහා හේතු පිළිබඳව සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| **කොන්ත්‍රාත් අංකය** | **මුල් වටිනාකම** | **සංශෝධිත වටිනාකම** | **වෙනස** |
|---|---|---|---|
| | රු | රු | රු |
| NP/01 | 458,115,063 | 410,693,157 | 12,578,094 |
| NP/02 | 421,502,519 | 426,894,391 | (608,128) |

(vi) පළාත් මාර්ග ව්‍යාපෘති එහි කටයුතු 2010 මැයි 23 දින ආරම්භ කර තිබුණි. උතුරු පළාතේ පළාත් මාර්ග ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක ලෙස පුද්ගලික සමාගමක් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පත් කර තිබුණි. යාපනය දිස්ත්‍රික්කයේ පැකේජ හතකින් යුත් මාර්ග කිලෝ මීටර් 100 ක් පුනරුත්ථාපනය කිරීම මුල් යෝජනාව වූ අතර මුල්‍ය අවහිරතා හේතුවෙන් පසුව එය පැකේජ 4 කින් යුත් මාර්ග කිලෝ මීටර් 55 දක්වා අඩු කරන ලදි. පහත විස්තර දැක්වෙන පරිදි සැලැස්මට අනුව නොවූ දුර්වල ප්‍රගතිය හේතුවෙන් මාර්ග පැකේජ 4 කින් පැකේජ් 2 ක කොන්ත්‍රාත්තු 2012 නොවැම්බර් 23 දින නවතා තිබුණි.

| නවතා දමන ලද කොන්ත්‍රාත් | කිලෝ මීටර් ගණන | මූල්‍ය ප්‍රගතිය | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | සැලසුම් කළ | ඉටුකර ගන්නා ලද | සැලසුම් කළ | ඉටුකර ගන්නා ලද |
| PRP/NP/03 | 14.0 | 83% | 21% | 76% | 5.23% |
| PRP/NP/05 | 12.4 | 87% | 16% | 74% | 0.75% |
| | 26.4 | | | | |

ඉහත කොන්ත්‍රාත්තු 2012 නොවැම්බර් 23 දින නවත්වා තිබුණද, ඉතිරි කිලෝමීටර් 26 .4 ක මාර්ග වැඩ නව කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමීම මඟින් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ උතුරු පළාත් ව්‍යාපෘතිය**

(i) මුල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව වර්ෂය සඳහා ලැබී තිබුණු රු.246,009,992 ක් වූ අරමුදල් වලින් රු.147,493,283 ක් වූ මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කාර්යයන් සඳහා උපයෝජනය කර තිබූ අතර එය වෙන් කරන ලද අරමුදල් වලින් සියයට 60 ක් නියෝජනය විය.

(ii) 2012 වර්ෂයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා උපදේශක සේවා වෙනුවෙන් රු.2,523,000 ක මුදලක් වෙන්කර තිබුණද, රු.654,600 ක් පමණක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

★ පුහුණු මොඩියුලයේ (Module) "ඒ " ඇමුණුම ප්‍රකාරව පුහුණුව සිදුකර නොතිබුණි.

- ★ කාර්ය සාධන සමාලෝචනය කිරීම සඳහා සඳහා රැස්වීම් 4 ක් පවත්වා තිබුණි. කෙසේ වුවද උපදේශක සහභාගීවී නොතිබූ අතර ජූලි මස පැවැත්විම සඳහා ඉල්ලීම් කළ ප්‍රදර්ශනය පැවැත්වීමට පියවර ගෙන නොතිබුණි.
- ★ කාර්තුමය වාර්තා ලබාගැනීමෙන් තොරව උපදේශකට ගෙවීම් කර තිබුණි. යොමුගත කොන්දේසි ප්‍රකාරව වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු කාර්තුමය වාර්තා හතරෙන් එක් වාර්තාවක් පමණක් උපදේශක විසින් ඉදිරිපත් කර තිබුණි.
- ★ කොන්ත්‍රාත් ගිවිසුමේ නියම කරන ලද පරිදි රක්ෂණ ආවරණයක් උපදේශක විසින් ඉදිරිපත් කර නොතිබුණි.
- ★ මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක සඳහා උපදේශක විසින් ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදුකර නොතිබුණි. අදාළ වෘත්තීයික හිඟකම හේතුවෙන් මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක සඳහා උපදේශක විසින් සෞඛ්‍ය ප්‍රවර්ධන පදනම් කාර්ය මණ්ඩලයක් පත් නොකළ බවත් දිස්ත්‍රික්ක පහේම ව්‍යාපෘතියට අදාළ කාර්යයන් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOMCH) හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ((MOH) විසින් ඉටුකරන බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා තිබුණි.

(iii) මවුවරුන්ගේ සංගම් සඳහා සහායවීමට ලෝක බැංකුව නිර්දේශ කර තිබුණද, සංරචක 3 යටතේ මවුවරුන්ගේ සංගම් වලට කිසිඳු ප්‍රසම්පාදනයක් සිදුකර නොතිබුණි.

### (ඇ) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP PROJECT)

ව්‍යාපෘති යෝජනාව අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් පහක් වෙනුවෙන් රු.මිලියන 9,662 ක මුදලක් අයවැයගත කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1,408.52 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 85 ක් උපයෝජනය නොකර පැවතුණි.

**(ඈ) උතුරු පළාත වහාම යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය ( Emergency Northern Recovery Project )**

ප්‍රදාන ගිවිසුමේ 1 වර්ගය යටතේ භාණ්ඩ හා උපදේශක සේවා සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ කිසිඳු වියදමක් දරා නොතිබුණු අතර 2 වර්ගය යටතේ වියදම ප්‍රතිපාදන ඉක්මවා තිබුණි.

**(ඉ) උතුරු පළාත වහාම යථා තත්ත්වයට පත්කිරීමේ ව්‍යාපෘතිය ( ඕස්ට්‍රේලියන් ව්‍යාපෘතිය) (Emergency Northern Recovery Project - Australian Fund )**

ප්‍රදාන ගිවිසුමේ 1 වර්ගය යටතේ භාණ්ඩ හා උපදේශක සේවා සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී කිසිඳු වියදමක් දරා නොතිබුණු අතර 2 වර්ගය යටතේ වියදම රු.284,075,171 කින් ප්‍රතිපාදනය ඉක්මවා තිබුණි.

**(ඊ) ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශ වහාම යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය ("ඒ" සංරචකය ) (CARE ) (Component A)**

(i) ව්‍යාපෘති යෝජනාව අනුව සමාලෝචිත සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා වර්ග හයක් වෙනුවෙන් රු.මිලියන 9,924.2 ක මුදලක් අයවැයගත කර තිබුණි. කෙසේ වුවද මේ යටතේ 2012 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 3,405 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් අයවැයගත ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘති අරමුදල් සියයට 66 ක් උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණි.

(ii) ප්‍රතිපත්ති සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ 2002 ඔක්තෝබර් 15 දිනැති එම්පීපීඅයි/එම්පීආර්ඩී / වාහන , දරන චක්‍රලේඛයට පටහැනිව 2012 අප්‍රේල් 31 දක්වා වාහන 3 ක් කුලියට ගැනීම වෙනුවෙන් වාහන කුලී ගාස්තු ලෙස දළ වශයෙන් රු.4,322,687 ක මුදලක් ගෙවා තිබුණි. තවද දළ වශයෙන් කිලෝමීටරයකට රු.90 බැගින් කොළඹ පුද්ගලික සමාගමකට වාහන කුලී ගාස්තු ගෙවා තිබුණි. කෙසේ වුවද යාපනයේ කුලී ගාස්තු කිලෝමීටරයකට රු.50 ක් පමණක් වූ අතර, ගණුදෙනුවේ ආර්ථිකභාවය සැලකිල්ලට ගැනීමෙන් තොරව විශාල මුදල් ප්‍රමාණයක් කුලී ගාස්තු ලෙස ගෙවා තිබුණි.

## 2.17 පළාත් පාලන ආයතන කටයුතු පිළිබඳ අධීක්ෂණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේ 8 වන උපලේඛනයේ 4.2 වගන්තියේ ඇතුළත් විධිවිධාන වලට අනුව, පළාත් පාලන ආයතන පිළිබඳ අධීක්ෂණය පළාත් සභාවට පවරා තිබුණි. පළාත් පාලන ආයතන පිළිබඳ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී නිරික්ෂණය වූ කරුණු අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරන ලදි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ පළාත් පාලන අයතන 34 න් පළාත් පාලන ආයතන 25 ක් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 ට පෙර විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද උතුරු පළාතේ පළාත් පාලන ආයතන 9 ක සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 30 ට පෙර ඉදිරිපත් කර තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රකාශ කරන ලද තත්ත්වාගණනය කළ විගණන මතය හා ව්‍යාවනය කළ විගණන මතය පිළිබඳ අවස්ථා පහත දැක්වේ.

| **දිස්ත්‍රික්කය** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද අවස්ථා ගණන** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව්‍යාවනය කරන ලද විගණන මතය ප්‍රකාශ කරන ලද අවස්ථා ගණන** |
|---|---|---|
| | | - |
| යාපනය | 16 | 01 |
| මුලතිව් | 04 | - |
| කිලිනොච්චි | 03 | - |
| වවුනියා | 05 | - |
| මන්නාරම | 01 | - |
| | 29 | 01 |

(ඇ) පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ඵලදායී හා අර්ථවත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ප්‍රධාන ලේකම් හෝ උතුරු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය, ප්‍රසම්පාදන කමිටු තීරණ ආදිය අනුගමනය කිරීමෙන් තොරව මාර්ග, වැසිකිළි හා නළ ළිං වැඩ සඳහා කොන්ත්‍රාත්තු ග්‍රාම සංවර්ධන සමිති, කාන්තා ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රජා මධ්‍යස්ථානවලට ප්‍රදානය කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අත්පොතේ 3.9.1 වගන්තිය ප්‍රකාරව ප්‍රජා මධ්‍යස්ථානවලට නොව පළාත් පාලන අංශයේ සංවර්ධන කාර්යයන්වලට දායකවන ප්‍රජා සංවර්ධන සමිතිවලට (Community Development Societies ) පමණක් කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතුය.

(ඉ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, පළාත් පාලන ආයතන 34 ට අදාළව, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම පහත විස්තර දැක්වෙන පරිදි රු.563,665,805 ක් විය.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | හිඟ ආදායම |
|---|---|---|
| | | රු. |
| යාපනය | 17 | 474,147,505 |
| මුලතිව් | 04 | 16,334,611 |
| කිලිනොච්චි | 03 | 2,575,735 |
| වවුනියා | 05 | 48,056,263 |
| මන්නාරම | 05 | 22,551,691 |
| | 34 | 563,665,805 |

**(ඊ) උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීම**

වාවස්ථාපිත විධිවිධාන අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටි උසාවි මඟින් පනවන ලද දඩ හා දේපල පැවරීම්වලට අදාළ පළාත් සභා හෝ වෙනත් පළාත් පාලන ආයතන විසින් රඳවාගත් මුද්දර ගාස්තු කාලීනව ඉල්ලීම් නොකිරීම හේතුවෙන් අදාළ පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කිරීමෙන් තොරව උසාවිවල රඳවා ගෙන තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට අයකර නොගන්නා ලද උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | හිඟ මුද්දර ගාස්තු | හිඟ උසාවි දඩ |
|---|---|---|
| | | රු. |
| යාපනය | 191,158,926 | 45,043,221 |
| මුලතිව් | 10,018,147 | 101,200 |
| කිලිනොච්චි | 5,184,430 | 5,611,233 |
| වවුනියා | 34,473,179 | 7,997,604 |
| මන්නාරම | 11,628,265 | 81,725 |
| | 252,462,947 | 58,834,983 |

(උ) පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු සාරාංශ කර පහත දැක්වේ.

(i) විවිධ රාජ්‍ය නොවන සංවිධානයන්ගෙන් (NGOS) විශේෂයෙන් සුනාමියෙන් පසුව පරිත්‍යාග හා තෑගි ලෙස ලැබුණු වත්කම් හා ඉන්වෙන්ට්‍රි විෂයන් විධිමත්ව ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

(ii) පළාත් පාලන ආයතනවල මානව සම්පත් විශේෂයෙන් සුනාමියෙන් පසුව විවිධ ආයතන / රාජ්‍ය නොවන සංවිධාන විසින් විධිමත් අනුමැතියක් නොමැතිව උපයෝජනය කර තිබුණි.

(iii) පළාත් පාලන කොමසාරිස්වරයාගේ විමර්ශන නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(v) පාලන ගිණුම්වල ශේෂ, උපයෝගී ලේඛන හෝ වාර්තාවල දැක්වෙන ශේෂ සමඟ සසඳා නොතිබුණි.

(vi) නිල වාහන භාවිතා කිරීමට හිමිකම් නොමැති පළාත් පාලන ආයතන කිහිපයක මන්ත්‍රීවරුන් නිල වාහන භාවිතා කර තිබුණි.

(vii) පළාත් පාලන ආයතන විසින් ස්වකීය කම්කරු බලකාය යොදා ගනිමින් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කරවා තිබුණි. කෙසේ වුවද විධිමත් කාර්ය පත්‍රිකා පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉන්වෙන්ට්‍රි පාලනයක් හෝ තොග පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන්, තොග තත්ත්වය පරීක්ෂා කිරීමට හෝ තොග ඌනතා / අතිරික්ත නිශ්චය කිරීමට විගණනයේදී නොහැකි විය.

(viii) ඉඩම් හා ගොඩනැඟිලි තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ බැවින් පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැඟිලි තථ්‍ය වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ix) විවිධ පාර්ශ්වයන් විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පළාත් පාලන ආයතනවල වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(x) වර්ෂ 25 කට වැඩි කාලයක් දේපල තක්සේරු කර නොතිබීම හේතුවෙන් වරිපනම් හා බදු වැඩි කිරීමට නොහැකිවී තිබුණි.

(xi) ප්‍රාදේශීය සභා සතු ඉඩම් කිහිපයක් උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් බස් නැවතුම්පොළවල් සඳහා යොදා ගෙන තිබුණද, උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයෙන් කිසිඳු අයකිරීමක් සිදුකර නොතිබුණි.

(xii) යාපනය, මහ නගර සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පත්කිරීම් කර තිබුණි. එම අනුමැතිය නොලත් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ලෙස මහ නගර සභා අරමුදලින් රු.80,653,741 ක මුදලක් මේ සම්බන්ධයෙන් ගෙවා තිබුණි.

(xiii) පළාත් පාලන සේවාවන් විසින් කරන ලද විශ්‍රාම වැටුප් දායකය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඌ) විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පහත විස්තර දැක්වෙන පරිදි රු.1,495,473,817 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| දිස්ත්‍රික්කය | මුදල |
|---|---|
| | රු. |
| යාපනය | 1,174,406,448 |
| මුලතිව් | 86,399,603 |
| වවුනියා | 220,514,060 |
| කිලිනොච්චි | 14,153,706 |
| | 1,495,473,817 |

(එ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන ආයතන විසින් දරන ලද එකතුව රු.753,536 ක් වූ වියදම් පහත විස්තර දැක්වෙන පරිදි ආර්ථික නොවූ ගනුදෙනු ලෙස සැලකිය හැක.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| සැම්සුන් ගැලක්ෂි S III දුරකථනය මිලදී ගැනීම | 99,990 |
| මාසික රැස්වීම් සඳහා ආහාර පාන වියදම | 438,042 |
| නල්ලූර් උත්සවයේ වියදම් | 74,575 |
| පාපන්දු කණ්ඩායම සඳහා ආහාර පාන | 110,929 |
| නව වසර කාඩ්පත් සඳහා මුද්‍රණ ගාස්තු | 30,000 |
| | 753,536 |

**(ඒ) අත්හැර දැමූ ව්‍යාපෘති**

අරමුදල් නොමැතිවීම හේතුවෙන් රු.222,079,000 ක් වටිනා ව්‍යාපෘති 53 ක වැඩ සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

**(ඔ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළදී වටිනාකම රු.132,439,354 ක් වටිනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු කාල ප්‍රමාදයන් නිරික්ෂණය විය.

## 3. ශිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව 2010 වර්ෂය සිට අවම වශයෙන් ඉදිරි වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පළාත් සභාව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

### 3.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව , පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව පළාත් සභාව විසින් 2010 වර්ෂය සහ ඉදිරි වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

### 3.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

### 3.4 අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කටයුතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මුදල් රීති 99 ප්‍රකාරව, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ආණ්ඩුකාරවරයාගේ ලේකම් කාර්යාලය විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන වැඩ සටහන සකස් කිරීමේදී පළාත් මුදල් රීති 101 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගෙන නොතිබුණි.

(ඇ) පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද විවිධ කරුණු සම්බන්ධයෙන් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන විමසුම්වල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම**

2000 ජුනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තු කිහිපයක් විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**3.6 උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2006 දෙසැම්බර් 22 දින දෙන ලද නියෝගය පදනම් කරගෙන එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කරන ලදී. 2007 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් සභාව ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, වෙන් කිරීම පිළිබඳව හා උතුරු පළාත් සභාව පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 2013 දෙසැම්බර් 31 දක්වා ප්‍රසිද්ධ කර නොතිබුණි. එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කර වර්ෂ 6 ක් සම්පූර්ණ වීමෙන් පසුව, පත් වූ උතුරු පළාත් සභාව 2013 ඔක්තෝබර් 25 දින පිහිටුවා තිබුණි.

**3.7 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**(අ) පළාත් සභාවේ අරමුදල් ගිණුම්**

පළාත් සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් ගිණුම් 2013 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල**

2007 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් සභාව සඳහා ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලක් ක්‍රියාත්මක කරන ලදී. එහෙත් අරමුදල ඇති කිරීම පිළිබඳ ව්‍යවස්ථාව පළාත් සභාවේ අනුමත කර නොතිබුණි. කෙසේ වුවද, එවකට උතුරු නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා විසින් ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල ඇති කරන ලදී. 2007 ජනවාරි 01 දිනැති අංක 01/2007 දරන

ආණ්ඩුකාරවරයාගේ සටහනේ 03 ඡේදය ප්‍රකාරව පොදුජන සාමාජිකයන්ගෙන් සංවිධානවලින්, සමිතිවලින් ලැබෙන පරිත්‍යාග හා දායක මුදල්වලින් සහ භාරගත් ව්‍යාපෘතිවලින් උපයන ලද ආදායමින් ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදල සමන්විත විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඉහත ප්‍රභවයන්ගෙන් එවැනි දායක මුදල් ලැබී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද සටහනකින් හෝ අරමුදල ඇතිකිරීම සඳහා පළාත් සභාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාවකින් තොරව උතුරු පළාතේ ආණ්ඩුකාරවරයාගේ භාර අරමුදලේ මෙහෙයුම් ස්ථාපිත කරන ලදී.

**(ඇ) වෙනත් මූල්‍ය ප්‍රකාශන**

2013 අප්‍රේල් 30 දිනට සමාලෝචිත වර්ෂය සඳහා වූ වෙනත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | **මූල්‍ය ප්‍රකාශන වර්ගය** | **ඉදිරිපත් කළ යුතු මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** | **2013 අප්‍රේල් 30 දක්වා ඉදිරිපත් කරන ලද මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** | **2013 අප්‍රේල් 30 දිනට ඉදිරිපත් නොකරන ලද මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (අ) | විසර්ජන ගිණුම් | 32 | 32 | - |
| (ආ) | ආදායම් ගිණුම් | 06 | - | 06 |
| (ඇ) | පළාත් රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 32 | 32 | - |
| (ඈ) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු | 04 | 02 | 02 |
| | | 74 | 66 | 08 |

**3.8 පළාත් සභාව හා පළාත් පාලන ආයතන විසින් වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම**

(i) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ii) 2004 පෙබරවාරි 24 දිනැති අංක 1/2004 දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව උතුරු පළාත් සභාව යටතේ වූ පළාත් පාලන ආයතන 34 ක වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.9 වාර්ෂික වාර්තා විගණකාධිපතිවරයාගේ වාර්තා සමඟ පළාත් සභාවේ සභාගත කිරීම

පත්වූ පළාත් සභාව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව 2007 සිට 2011 දක්වා වූ වර්ෂ සඳහා උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා 2013 නොවැම්බර් 30 දින දක්වා පළාත් සභාවේ සභාගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2007 වර්ෂයේ සිට විගණකාධිපති වාර්තාවල පෙන්වා දී තිබුණු කරුණු නිවැරදි කර ගැනීමට පළාත් සභාව විසින් කිසිදු යාන්ත්‍රණයක් අනුගමනය කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

කාර්ය මණ්ඩල බඳවා ගැනීම හා පාරිශ්‍රමික ගෙවීම, වත්කම් ප්‍රසම්පාදනය ගිණුම්කරණ පරිපාටි, ගිණුම් වාර්තා පවත්වා ගැනීම, වත්කම් උපයෝජනය ආදියෙහි අඩුපාඩු නිරීක්ෂණය වූ බැවින්, සභාවේ පරිපාලනයේ හා මූල්‍ය කළමනාකරණයේ ආර්ථික බව හා ඵලදායී බව තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වන පද්ධති හා පාලන ප්‍රමාණවත් නොවූ බව අනාවරණය විය. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා පාරිශ්‍රමික ගෙවීම
(ආ) අතිකාල, නිවාඩු දින වැටුප්, වැඩ බැලීමේ වැටුප් හා සංග්‍රහ දීමනා ගෙවීම
(ඇ) ගෙවීම් වවුචර් සහතික කිරීම
(ඈ) මුදල් රැස්කිරීම හා වියපැහැදම් කිරීම
(ඉ) ගබඩා පරිපාටි
(ඊ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම
(උ) නිල වාහන උපයෝජනය
(ඌ) රජයේ නිල නිවාස වෙන්කිරීම හා පවත්වා ගැනීම
(එ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම
(ඒ) අභ්‍යන්තර විගණනය
(ඔ) අත්තිකාරම් ගිණුම් කටයුතු පිළිබඳ පාලනය